# බළන්ගොඩ නගර සභාව

## 2018-12-13 වන දිනැති මහා සභාවේ රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2018.12.13**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | අකිල සාළිය එල්ලාවළ මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 10. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 11. ගරු නාගරික මන්ත්‍රී | එම්. එස්. පී. ගලප්පත්ති මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රී | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 13. ගරු නාගරික මන්ත්‍රී | එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 14. ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 15. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. එස්. ඩී. වීරසිංහ මැතිතුමිය |
| 16. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 17. ගරු නාගරික මන්ත්‍රී | කේ. ජී. පේමදාස මැතිතුමා |

**නිළධාරී සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ලේකම් | එස්.එච්.ඒ.කරුණාරත්න මිය |

## 01. පසුගිය සභාවේ සභා වාර්තාව හා විශේෂ සභා වාර්තාව සම්මත කිරීම.

2018-12-13 වන දින මාසික මහසභාවේ වැඩකටයුතු ආරම්භ කල ගරු සභාපතිතුමන් විසින්,2018.11.08 දින පැවති මහ සභාවේ සභා වාර්තාව හා 2018.12.05 දින පැවති විශේෂ සභාවේ සභා වාර්තාව සත්‍යය වාර්තා බවට සභා සම්මත කර ගන්නා ලෙස පවසා සිටින ලදී.

එහිදී ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් 2018.11.08 දින පැවති මහ සභාවේ සභා වාර්තාව හා 2018.12.05 දින පැවති විශේෂ සභාවේ සභා වාර්තාව සත්‍යය වාර්තාවක් බවට යෝජනා කල අතර ගරු නාගරික මන්ත්‍රි එම්.ඩබ්.විමළසිරි මැතිතුමන් විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

මෙම වාර්තාවන්හි සංශෝධන තිබේදැයි ගරු සභාපතිතුමන් විසින් විමසා සිටි අවස්ථාවේදි , පිළිතුරු ලබාදුන් ගරු නාගරික මන්ත්‍රි ඩබ්.එම්.එන්.පී.වීරසිංහ මැතිතුමන් විසින් කොට්ඨාශයේ සංවර්ධනය සඳහා සභාව මගින් වෙන්කරන ලද ලක්ෂ 10 න් ලක්ෂ 4 ක් පුද්ගලික මන්ත්‍රි ප්‍රතිපාදන සඳහා ලබාදී ඉතිරි ලක්ෂ 6 ද එම කර්මාන්තයේ ඉතිරි කොටස් සඳහා යොදවා එම කර්මාන්ත අවසන් කිරීම සිදු කිරීම කෙරෙහි ගරු සභාවේ අවධානය යොමුකිරීම යන යෝජනාව යටතේ නගර සභා විශ්‍රාම ගිය ආනන්ද මහතාගේ නිවාස වලට යන මාර්ගය සංවර්ධනය කිරීම සඳහා ඇති කොටස පෙර කොටස සංවර්ධනය කරන ලද සමිතිය වෙතට ලබාදී සංවර්ධනය කිරීම සිදුකරන ලෙස සංශෝධනය විය යුතුබව පවසා සිටින ලදී.

එමෙන්ම අයවැය කෙටුම්පතට අදාළව අදහස් ඉදිරිපත් කල ගරු නාගරික මන්ත්‍රි ඩබ්.එම්.එන්.පී.වීරසිංහ මැතිතුමන් විසින් , අයවැය කෙටුම්පතෙහි මන්ත්‍රි යෝජනා පෙළගස්වා නොමැති බවත් ,විශ්ව විද්‍යාල සිසුන්ට ශිෂ්‍යත්ව මුදල් රු.10,0000 දක්වා වැඩිකිරීමේ යෝජනාව අඩංගු වී නොමැති බවත්, බලගහමුල කඩපේළියක් ඉදිකිරීම සම්බන්ධයෙන් සභාව දැනුවත් නොමැති අතර අයවැයේ අඩංගු නැති යෝජනා ඉදිරියේදි ක්‍රියාත්මක කිරීම ගැටළුකාරී බවද පවසා සිටින ලදී. තවදුරටත් අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රි ඩබ්.එම්.එන්.පී.වීරසිංහ මැතිතුමා සභාව නියෝජනය කරනු ලබන ප්‍රධාන පක්ෂ 4 ටම සාධාරණ වන පරිදි සභාවේ සංවර්ධන කටයුතු ඉටුකරනු ඇතැයි අපේක්ෂා කරන බව පවසා සිටි අතරම විශේෂ සභාව දින කල් තබන ලෙස ඉල්ලීමක් ඉදිරිපත් කලද එය කල් නොදැමීම සම්බන්ධයෙන් විරෝධය පෑමට මෙය අවස්ථාවක් කරගන්නා බවද පවසා සිටින ලදී.

මේ සඳහා පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමන් විසින් සභාවක් නියමානුකූලව කැඳවීමෙන් පසුව සභාව කල් තැබීමක් සිදු කරන්නේ නම් ඒ සඳහා සභාව රැස්වී අඩාලව කල්තැබීමට යෝජනා ස්ථිර කරගත් පසු කල් තැබීමක් සිදු කල හැකි අතර එසේ නොකර සභාවක් කල් තැබීම සිදු කල නොහැකි බවත් එය

සභා රීතින්ට පටහැනි බව පෙන්වා දෙන ලදී.එමෙන්ම අයවැය කෙටුම්පත මේවන විට සම්මත වී ඇති අතර සම්මත වීමෙන් පසුව ක්‍රමානුකූලව මුද්‍රණය කරන ලද අයවැය සියළු පාර්ශව වෙත ලබාදෙන බව පවසා සිටින ලදී.

මෙහිදී ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් සංශෝධනයන්ට යටත්ව 2018.11.08 දින පැවති මහ සභාවේ සභා වාර්තාව හා 2018.12.05 දින පැවති විශේෂ සභාවේ සභා වාර්තාව සත්‍යය වාර්තවක් බවට යෝජනා කල අතර,ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදුව එම වාර්තාවන් සත්‍ය වාර්තා බවට සභා සම්මත විය.

**02. ගරු සභාපතිතුමන් විසින් කරනු ලබන නිවේදන**

ගරු සභාපතිතුමන් විසින් සිය නිවේදන ආරම්භ කරමින් විවිධ ප්‍රවේශ මගින් දේශපාලනයට පිවිසියා වූ මන්ත්‍රිවරුන්ගෙන් සමන්විත වූ සභිකයන් ගෙන් යුත් සභාවක් ලෙස ආරම්භය කෙසේ වෙතත් මේවන විට යම් සන්ධිස්ථානයකට පැමිණි මහජන නියෝජිතයන් වශයෙන් නගරයට වැඩදායි හා සභාව ශක්තිමත් කල හැකි පරිදි බලංගොඩ ජනතාවට සේවය සැපයීම සඳහා ක්‍රියා කිරීමට කැපවෙමුයි පවසා සිටින ලදී.

**03. සංදේශ / පැමිණිලි / පෙත්සම් / ආයාචනා / ටෙන්ඩර් ඉදිරිපත් කිරීම**

03:01 **සංදේශ / පැමිණිලි / පෙත්සම් / ආයාචනා**

සංදේශ ,පැමිණිලි , පෙත්සම් හා ආයාචනා ඇත්නම් සභාවට ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමන් විසින් පවසා සිටි අවස්ථාවේ ගරු නාගරික මන්ත්‍රි අකිළ එල්ලාවල මැතිතුමන් විසින් පෙත්සම් 2 ක් ලැබී ඇති බව පවසා සිටින ලදී.

1. සේනක පෙදෙස සරත්චන්ද්‍ර ගරාජ් වෙතින් කාබයිඩ් පිච්චීම නිසා ඇතිවන දුගඳ නිසා මහජනතාව මහත් පීඩාවකට ලක් වී ඇති බවත්, මෙය සෞඛ්‍යයට හානිදායක තත්වයක් මෙන්ම,නගරයේ ප්‍රධාන ස්ථානයක මෙය පිහිටුවා තිබීම නීති විරෝධි බව පවසා සිටි ගරු නාගරික මන්ත්‍රි අකිළ එල්ලාවල මැතිතුමන් විසින් මේ පිළිබඳව ගරු සභාවේ අවධානය යොමුකරන මෙන් ඉල්ලා සිටින ලදී.

2. කරව්කැටිය පාර පදිංචි ටී.එම්.විමළරත්න බණ්ඩාර මහතාගේ නිවෙස අසළ වර්ෂාව නිසා දරුණු ලෙස නාය යාමකට ලක්වී ඇති හෙයින් ඉඩම් හා නිවාස කිහිපයකට යාමට නොහැකි කමින් පීඩාවට පත්ව සිටින ජනතාවගේ ගැටළුව පිළිබඳව ගරු සභාවේ අවධානය යොමුකරන මෙන් ඉල්ලා සිටින ලදී.

මේ සඳහා පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමන් විසින් මේ සඳහා විශාල මුදලක් වැයවන බැවින් ඉදිරියේදි ප්‍රතිපාදන ලද විගස මෙම කර්මාන්තය ඉටු කිරීමට අපේක්ෂා කරන බව පවසා සිටින ලදී.

●ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ,

1.සරස්වතී මාර්ගය සංවර්ධනය කිරීමේදි ඉඩමක අයිනක් කැපීම හේතුවෙන් ක්‍රියාන්විත රාජකාරියේ නිරතව සිටින මහත්මයකුගේ ඉඩම සේදී යාමේ අවදානමක් පවතින බවත්, ඒ සඳහා ගරු සභාවේ අවධානය යොමුකරන මෙන් ඉල්ලා සිටි අවස්ථාවේ එයට පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමන් විසින්,නඩත්තු මුදලින් එහි කාණුවේ ඉදිරි කොටස කොන්ක්‍රීට් කරදීම අපේක්ෂා කරන බව පවසා සිටින ලදී.

2.සේනක පෙදෙස ටයිටස් මහතාගේ නිවස අසළින් ජල පහරක් ගලා යාම නිසා ඔවුන් අපහසුතාවයට පත් ව ඇති බවත් මෙම කොටස කානුවක් සකස්කර සංවර්ධනය කිරීම පිළිබඳ ගරු සභාවේ අවධානය යොමුකරන මෙන් ඉල්ලා සිටින ලදී.

3. එමෙන්ම බස් නැවතුම්පොළ ඩී 1 දරණ ස්ථානයේ ශ්‍රී කාන්තන් ශ්‍රී ගෝවින්දන් විසින් අතුල කරුණාරත්න යනඅය සමග හවුල් ව්‍යාපාරයක් කරගෙන යන බවත් ශ්‍රී කාන්තන් ශ්‍රී ගෝවින්දන් මහතා විදේශගත වන බැවින් කඩකාමරයේ බදු අයිතිය අතුල කරුණාරත්න මහතාට පවරා දෙන මෙන් පවසා සිදුකරන ලද ඉල්ලීමට පිළිතුරු සැපයූ ගරු සභාපතිතුමා නීත්‍යානුකුල ක්‍රම වේදයට යටත්ව එම කටයුතු සිදු කර ගැනීමට හැකි බව පවසා සිටින ලදී.

● ගරු නාගරික මන්ත්‍රිනි පී.චන්ද්‍රලතා මැතිතුමිය අදහස් දක්වමින්, හුණුකුඹුර බී.ඒ.ප්‍රනාන්දු මහතාගේ නිවස අසළින් යන ජල පහර පහළ සිටින දුවිඩ ජනතාවට අයත් නිවෙස් කිහිපයක් තුලින් ගලායන බැවින් මහත් සේ පීඩාවට පත් ව සිටින එම ජනතාවගේ ගැටළුව විසදීම කෙරෙහි ගරු සභාවේ අවධානය යොමුකරන මෙන් ඉල්ලා සිටින ලදී.

මින් අනතුරුව බලංගොඩ නගර සභාව සතු පොදු වෙළෙඳ සැල මාළු කඩ අංක 12 හා රථවාහන නැවතුම් ගාස්තු අයකිරීම සඳහා සුදුසු බදුකරුවන් තෝරාගැනීමට ප්‍රසිද්ධ දැන්වීම් පලකර ලංසුපත් කරඳවා තිබූ අතර එම ටෙන්ඩර්පත් විවෘත කිරීම සඳහා ගරු සභාපතිතුමන්ගේ යෝජනත්වයෙන් ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමළසිරි මන්ත්‍රීතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු සභාව කාරක සභාවක් බවට පත්කරන ලදී.

එහිදී ටෙන්ඩර්පත් විවෘත කිරීමෙන් පසුව ගරු සභාපතිතුමන්ගේ යෝජනත්වයෙන් ගරු උප සභාපතිතුමන්ගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව නැවත ගරු සභාවක් බවට පත්කරන ලදී.

03:02 **ටෙන්ඩර් මණ්ඩල තීරණ ඉදිරිපත් කිරීම**

03:02:01 පොදු වෙළෙද සැල අංක 12 දරණ මාළු කඩ කාමරය නිකුත් වී තිබූ එකම ලංසුපත වන එම්.කේ.මුතුමාළ මහතාට රු.3100.00 මුදලට ලබාදීමට ටෙන්ඩර් මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණය ක්‍රියාත්මක කිරීමට සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර ඒ සඳහා විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

03:02:02 බලංගොඩ නගරයේ රථ වාහන නැවතුම් ගාස්තු අය කිරීමේ ටෙන්ඩරය සඳහා ලංසුපත් 2ක් නිකුත් වී තිබූ අතර එම ලංසුපත් විවෘත කර පරීක්ෂා කිරීමේදි අදාළ කොන්දේසි සම්පූර්ණ වී නොතිබූ හෙයින් 2019 වර්ෂය සඳහා රථ වාහන නැවතුම් ගාස්තු අය කිරීමේ ටෙන්ඩරය සඳහා සුදුසු බදු කරුවෙකු තෝරාගැනීමට නැවත ටෙන්ඩර් කැඳවීමටත් එම ටෙන්ඩර් පත් විවෘත කිරීම 2018-12-28 දින සිදුකිරීමට ටෙන්ඩර් මණ්ඩල තීරණය කරන ලද අතර එම තීරණය ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර ඒ සඳහා විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04. කල් දී ඇති ප්‍රශ්න**

නගර සභා ආඥා පනත ,සම්මත අතුරු ව්‍යවස්ථාව අනුව මස්,මාළු,එලවළු,පළතුරු විකිනීම සඳහා සභාව බලපත්‍ර නිකුත් කරනනේ කෙසේද? (ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා)

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් ඉදිරිපත් කර ඇති නගර සභා ආඥා පනත ,සම්මත අතුරු ව්‍යවස්ථාව අනුව මස්,මාළු,එලවළු,පළතුරු විකිනීම සඳහා සභාව බලපත්‍ර නිකුත් කරන්නේ කෙසේද යන ගැටළුවට පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමන් විසින් පොළ භූමිය සංවර්ධනය කල පසු මස් හා මාළු එකම ස්ථානයක

අලෙවි කිරීමට අවශ්‍ය පහසුකම් ඇති කරන බවත් කාලාන්තරයක සිට කරගෙන ආ පරිදි මෙම කටයුතු වර්තමානයේ සිදුවන බවත්, ගැටුමක් ඇති කර නොගෙන මේ සඳහා සුදුසු ක්‍රියාමාර්ගයක් ඉදිරියේදි ගැනීමට අපේක්ෂා කරන බවත් පවසා සිටින ලදී.

**05. කල් දී ඇති යෝජනා**

05ඃ01 ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා

**කාරක සභා පත්කිරීම**

**05ඃ01ඃ01 මුදල් කමිටුවට පැවරෙන බලතල හා විෂය පථය**

**මුදල් කමිටුව පත් කිරීම 1939 අංක 61 දරණ නගර සභා ආඥා පනතේ 29 (1) උප වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාරව**

බළන්ගොඩ නගර සභාවේ කාර්යයන් හා කර්තව්‍යයන්ට අදාළව රුපියල් ලක්ෂ 05ක් දක්වා වූ වියදම් අනුමත කිරීම, රුපියල් ලක්ෂ 05 ක් දක්වා වූ ඇස්තමේන්තු අනුමත කිරීම ගරු සභාපතිවරයා විසින් සිදු කරනු ලබන රු. ලක්ෂ 05 ක් දක්වා වූ ගෙවීම් වෙනුවෙන් ආවරණ අනුමැතිය ලබාදීම, කර්මාන්ත කමිටුව, පුස්තකාල හා උපදේශන කමිටුව, සෞඛ්‍ය සණ අපද්‍රව්‍ය හා පරිසර කමිටුව, සංවර්ධන උපදේශන කමිටුව යන කමිටු වලින් නිර්දේශ කරනු ලබන රු. ලක්ෂ 05 දක්වා වූ වියදම් සඳහා අනුමැතිය ලබාදීම, රු. 250,000.00 සිට රු. 500,000.00 දක්වා වූ ප්‍රසම්පාදන කමිටුව ලෙස ක්‍රියාත්මක වීම අවස්ථානුකුලව තාක්ෂනික ඇගයීම් කමිටුව පත්කිරීම.නගර සභා ආඥා පනත, රජයේ විවිධ රෙගුලාසි, චක්‍රලේඛ, අතුරු ව්‍යවස්ථා හා රීතින් වලට අනුකුල වන පරිදි ආදායම් උත්පාදනය,ආදායම් ඒකරාශී කිරීම, වියදම් කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය මග පෙන්වීම හා පාලනය කිරීම, මූල්‍ය ස්ථාවරත්වය ගොඩ නැගීම සඳහා වන යෝජනා ගරු සභාවට ඉදිරිපත් කිරීම, ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් බලතල ක්‍රියාත්මත කිරීම උදෙසා,

1. ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා
2. ගරු උප සභාපති එම්. ටී. එම්. රුමි මැතිතුමා
3. ගරු නාගරික මන්ත්‍රි එම්. ජේ. මලීක්ෂා මැතිතුමා
4. ගරු නාගරික මන්ත්‍රිනී එම්. සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය
5. ගරු නාගරික මන්ත්‍රි එම්. ඩබ්. විමලසිරි මැතිතුමා

6. ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා
7. ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා
8. ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා

යන සාමාජිකයන් අට දෙනෙකුගෙන් සමන්විත මුදල් කමිටුව පත් කිරීම සඳහා වූ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර එම යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ජී. වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමන් විසින් මෙම යෝජනාව ඉදිරිපත් කිරීම විධිමත් නොවන බවත්,එය ඉදිරිපත් කිරීමේදි කුමන ආඥා

පනතේ කිනම් වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද්දක්ද යන්න සඳහන් විය යුතු බවත් පවසා සිටින ලදී.

ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් අදහස් දක්වමින් සභාපතිතුමන් කෙරෙහි විශ්වාසය තබා මෙම යෝජනාවට එකඟත්වය පල කර බවත්, ලක්ෂ 5 දක්වා සිදුකරන සියළු ගෙවීම් මුදල් කමිටුවේ අනුමැතිය යටතේ, සිදුකරන අතර අද දින වෙනතුරුත් ගරු සභාපතිතුමන් මගින් කිසිදු වංචනික ක්‍රියාවක් සිදු වී නොමැති හෙයින් මෙම යෝජනාව සදහා පක්ෂව ක්‍රියා කරන බව පවසා සිටින ලදී.

ගරු නාගරික මන්ත්‍රී වසන්ත ගුණරත්න මැතිතුමන් විසින් අදහස් දක්වමින් 2018 වර්ෂයේ සංවර්ධන කටයුතු සඳහා අයවැයෙන් වෙන්කරන ලද මුදලින් තවමත් ඇස්තමේන්තු සකස් කරමින් පවතින බවත් කොට්ඨාශය සඳහා වෙන්කරන ලද ලක්ෂ 10 මුදලින් මන්ත්‍රී ප්‍රතිපාදන සඳහා වෙන්කරන ලද ලක්ෂ 4 ක මුදලවත් මේවන විට කිසිදු සංවර්ධන කාර්යයකට යොමුකර නොමැති බවත් පවසා සිටි අතර ඉහත යෝජනාවට විරුද්ධව බෙදීමක් යෝජනා කරන බව පවසා සිටින ලදී. එම බෙදීම ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර 2018 වසරේ කොට්ඨාශ සඳහා වෙන්කරන ලද මුදල් පිළිබඳව සෑහිමකට පත්විය නොහැකි බවත් එහි විෂමතා පැහැදිලිව පෙනෙන බවත් එහිදී කිරිදිගල වසමට රු.2,907,000.00 ක්ද,දෙහිගස්තළාව වසමට රු.2,796,000.00ක්ද කුමාරගම වසමට රු.2,618,000.00 ක්ද නගරයට 1.560,000.00 ක්ද බලංගොඩ වසමට 1,757,000.00 ක්ද, බුළත්ගම වසමට රු. 827,000.00ක්ද, ඕළුගංතොට

වසමට රු.1,715,000.00ක්ද හුණුකුඹුර වසමට රු.700,000.00ක්ද ඇල්ලෙපොල වසමට රු. 650,000.00 ක්ද තුඹගොඩ වසමට රු. 700,000.00 ක් ලෙස ප්‍රතිපාදන වෙන්කිරීමේ විෂමතා ඇති බව පවසා සිටින ලදී.

මෙහිදී ගරු සභාපතිතුමන් විසින් එකී බලතල ක්‍රියාත්මක කිරීම උදෙසා **මුදල් කමිටුව පත්කිරීම** සම්බන්ධයෙන් සභාගත කරන ලද යෝජනාවට පක්ෂව හා විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලෙස ගරු සභාවට පවසා සිටි අතර **යෝජනාවට පක්ෂව,**

1.ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා

2.ගරු උප සභාපති එම්. ටී. එම්. රුමි මැතිතුමා

3.ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා

4.ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා

5. ගරු නාගරික මන්ත්‍රී එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා

6. ගරු නාගරික මන්ත්‍රිනි පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය

7. ගරු නාගරික මන්ත්‍රිනි එම්. එස්. ඩී. වීරසිංහ මැතිතුමිය

8. ගරු නාගරික මන්ත්‍රිනි එම්. ශාන්තිලේඛා මැතිතුමිය

**ලෙස ඡන්ද 8 ක් ලැබුන අතර, යෝජනාවට විපක්ෂව,**

| | |
|---|---|
| 1. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රී | අකිල සාලිය එල්ලාවළ මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. ඒ. නදීෂාන් ප්‍රදීප් ජයසේන මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 8. ගරු නාගරික මන්ත්‍රී | එම්. එස්. පී. ගලප්පත්ති මැතිතුමා |

**ලෙස ඡන්ද 8 ක් ලැබුනි.**

**මෙහිදී ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.ජේමදාස මැතිතුමන් විසින් ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී.**

**ගරුසභාපතිතුමන් විසින් මෙම අවස්ථාවේ තම තීරක ඡන්දය ප්‍රකාශ කිරීමෙන් පසු යෝජනාවට පක්ෂව ඡන්ද 9 ක් පලවූ හෙයින් වැඩි ඡන්දයෙන් මුදල් කමිටුව පත්කිරීම**

**සම්බන්ධ වූ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා වන ඉහත යෝජනාව ගරු සභාවේ සභා සම්මත විය.**

**05:01:02 කර්මාන්ත කමිටුව**

**1939 අංක 61 දරණ නගර සභා ආඥා පනතේ 29 (1) උප වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාරව කර්මාන්ත කමිටුව පත්කිරීම**

නගර සභාව විසින් බල ප්‍රදේශය තුළ ඉටු කළ යුතු කර්මාන්ත සම්බන්ධව ප්‍රමුඛතා හඳුනාගෙන නිර්දේශ කිරීම, ප්‍රගතිය අදාළ පරිදි මුදල් කමිටුවට හා ගරු සභාවට ඉදිරිපත් කිරීම, කර්මාන්ත පිළිබඳ ගැටලු සම්බන්ධයෙන් නිර්දේශ ලබාදීම, තෝරා ගන්නා ලද කර්මාන්ත කරුවන් පිළිබඳ නිර්දේශ ලබාදීම යන කාර්යයන් ඉටු කිරීම, ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් බලතල ක්‍රියාත්මක කිරීම යන කරුණු උදෙසා

1. ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා
2. ගරු නාගරික මන්ත්‍රී එම්. ජේ. මලීක්ෂා මැතිතුමා
3. ගරු නාගරික මන්ත්‍රිනී එම්. සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය
4. ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා
5. ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා
6. ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා
7. ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා
8. ගරු නාගරික මන්ත්‍රිනී, එම්. ජී. ශාන්තිලේඛා මැතිතුමිය.
9. ගරු නාගරික මන්ත්‍රිනී, පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය.
10. ගරු නාගරික මන්ත්‍රී, කේ. ජී. ප්‍රේමදාස මැතිතුමා.

යන සාමාජිකයන් දස දෙනෙකුගෙන් සමන්විත කර්මාන්ත කමිටුව පත් කිරීම සඳහා වූ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රි ඩබ්.එම්.එන්.පී.වීරසිංහ මැතිතුමන් කර්මාන්ත කමිටුව සඳහා සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රි ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමන් විසින් යෝජනා කල අතර ගරු නාගරික මන්ත්‍රි නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමන් විසින් එය ස්ථිර කරන ලදී.

ගරු උප සභාපති එම්.ටී.එම්.රුමී මැතිතුමන්ගේ යෝජනත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රි අකිළ සාළිය එල්ලාවල මැතිතුමන්ගේ යෝජනා ස්ථිරත්වයෙන් කර්මාන්ත කමිටුව සඳහා ගරු නාගරික මන්ත්‍රි වසන්ත ගුණරත්න මැතිතුමන් හා ගරු නාගරික මන්ත්‍රි නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමන්ගේ නම් යෝජනා වූ අතර එම මන්ත්‍රිවරුන් දෙපළ විසින් එම යෝජනාව ප්‍රතික්ෂේප කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රි ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමන් විසින් මෙහිදී ගරු නාගරික මන්ත්‍රි නිමල් කරුණාරත්න මැතිතුමන් කර්මාන්ත කමිටුව සඳහා සුදුසු බවට ගෙනා යෝජනාව ගරු නාගරික මන්ත්‍රි එම්. ජේ. මලීක්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**එහෙයින් 2019 වර්ෂය සඳහා කර්මාන්ත කමිටුව ලෙස**

1. 1. ගරු උප සභාපති එම්. ටී. එම්. රුමී මැතිතුමා
2. ගරු නාගරික මන්ත්‍රි එම්. ජේ. මලීක්ෂා මැතිතුමා
3. ගරු නාගරික මන්ත්‍රිනී එම්. සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය
4. ගරු නාගරික මන්ත්‍රි එම්. ඩබ්. විමලසිරි මැතිතුමා
5. ගරු නාගරික මන්ත්‍රි රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා
6. ගරු නාගරික මන්ත්‍රි ලාල් ගලප්පත්ති මැතිතුමා
7. ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා
8. ගරු නාගරික මන්ත්‍රිනී, එම්. ජී. ශාන්තිලේඛා මැතිතුමිය.
9. ගරු නාගරික මන්ත්‍රිනී, පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය.
10. ගරු නාගරික මන්ත්‍රි, කේ. ජී. පේමදාස මැතිතුමා.
11. ගරු නාගරික මන්ත්‍රි ඩබ්.එම්.එන්.පී.වීරසිංහ මැතිතුමා.
12. ගරු නාගරික මන්ත්‍රි එම්.නිමල් කරුණාරත්න මැතිතුමා

සභාවේ විරෝධතා නොමැති හෙයින් මෙම සාමාජිකයන්ගෙන් යුත් කර්මාන්ත කමිටුව සභාවේ ඒකමතිකව සම්මත විය.

**05:01:03 පරිසර සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කමිටුව**

**1939 අංක 61 දරණ නගර සභා ආඥා පනතේ 29 (1) උප වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාරව පරිසර සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කමිටුව පත්කිරීම**

බලන්ගොඩ නගර සීමාව තුළ මහජනතාවට පොදුවේ බලපානු ලබන සෞඛ්‍ය ගැටලු පිළිබඳ සොයා බැලීම ඒවාට විසඳුම් යෝජනා කිරීම සහ නගරය පිරිසිදු කිරීම සම්බන්ධව පරීක්ෂා කිරීම හා වාර්තා කිරීම, බැංකියවත්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම, වැඩි දියුණු කිරීම සඳහා නිර්දේශ ලබාදීම, පාරිසරික සංරක්ෂණ කාර්යයන් හඳුනා ගැනීම සහ ඒ සඳහා නිර්දේශ සභාවට ඉදිරිපත් කිරීම, ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් බලතල ක්‍රියාත්මක කිරීම යන කරුණු උදෙසා

1. ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා
2. ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා
3. ගරු නාගරික මන්ත්‍රී එම්. ජේ. මලීක්ෂා මැතිතුමා
4. ගරු නාගරික මන්ත්‍රිනී එම්. සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය
5. ගරු නාගරික මන්ත්‍රිනී, පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය.
6. ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා
7. ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා
8. ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා

යන සාමාජිකයන් අට දෙනෙකුගෙන් සමන්විත පරිසර සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කමිටුව පත් කිරීම සඳහා වූ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමළසිරි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් පරිසර සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කමිටුව සඳහා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ

මැතිතුමන් හා ගරු නාගරික මන්ත්‍රී වසන්ත ගුණරත්න මැතිතුමන් සුදුසු බවට ගෙනා යෝජනාව ගරු නාගරික මන්ත්‍රී කේ.පී.පේමදාස මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**එහෙයින් 2019 වර්ෂය සඳහා පරිසර සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කමිටුව ලෙස,**

1. ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා
2. ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා
3. ගරු නාගරික මන්ත්‍රී එම්. ජේ. මලීක්ෂා මැතිතුමා
4. ගරු නාගරික මන්ත්‍රිනී එම්. සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය
5. ගරු නාගරික මන්ත්‍රිනී, පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය.
6. ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා
7. ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා
8. ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා
9. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.පී.වීරසිංහ මැතිතුමා
10. ගරු නාගරික මන්ත්‍රී වසන්ත ගුණරත්න මැතිතුමා

යන සාමාජිකයන්ගෙන් සැදුම්ලත් **පරිසර සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කමිටුව** කමිටුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05ඃ01ඃ04 පුස්තකාල උපදේශන කමිටුව පත්කිරීම**

**1939 අංක 61 දරණ නගර සභා ආඥා පනතේ 29 (1) උප වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාරව පුස්තකාල උපදේශන කමිටුව පත්කිරීම**

පුස්තකාල පොත් මිලදී ගැනීමට නිර්දේශ ලබාගැනීම, පාඨක සමාජයේ යෝජනා සම්මත කර ගැනීම, පුස්තකාල සංවර්ධන කටයුතු සාකච්ඡා කර අදාල යෝජනා මුදල් කමිටුවට /ගරු සභාවට ඉදිරිපත් කිරීම ,සඟරා නිකුත් කිරීමේ දී ලිපි ලබාගැනීම සහ සංස්කරණ කටයුතු සඳහා සහභාගි කර ගැනීම, ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් බලතල ක්‍රියාත්මක කිරීම යන කරුණු උදෙසා

**ගරු නාගරික මන්ත්‍රීවරුන් සහ මන්ත්‍රීවරියන්ගේ නියෝජනය**

1. ගරු නාගරික මන්ත්‍රිනී, එම්. ජී. ශාන්තිලේඛා මැතිතුමිය.
2. ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය.
3. ගරු නාගරික මන්ත්‍රිනී, එම්. සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය.
4. ගරු නාගරික මන්ත්‍රිනී, පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය.
5. ගරු නාගරික මන්ත්‍රි, ඩබ්. ඒ. නදීෂාන් ප්‍රදීප් ජයසේන මැතිතුමා.
6. ගරු නාගරික මන්ත්‍රි, කේ. ජී. පේමදාස මැතිතුමා.
7. ගරු නාගරික මන්ත්‍රි, එම්. ඩබ්. විමලසිරි මැතිතුමා.
8. ගරු නාගරික මන්ත්‍රි, ලාල් ගලප්පත්ති මැතිතුමා.
9. ගරු නාගරික මන්ත්‍රි, එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා.
10. ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා
11. ගරු නාගරික මන්ත්‍රි එම්. ජේ. මලීක්ෂා මැතිතුමා

**ප්‍රජා නියෝජනය**

12. ටී. එම්. නෙයිසූර් මිය
13. ධර්මසේන සමරසිංහ මයා
14. එච්. ඒ. බී. අයි. සිරිවර්ධන මයා
15. එම්. පී. එස්. ඩී. නාවනැල්ල මයා
16. ඉන්ද්‍රානි වීරසේකර මිය
17. අනිල් අල්විස් මයා
18. එම්. ජෙයරාජන් මයා
19. කුසුමා අබේසිංහ මිය
20. ඒ. එල්. අක්බර් අලී මයා
21. ඉන්ද්‍රානි එස්. රත්නායක මිය
22. දයානන්ද බෙනරගම මයා

යන සාමාජිකයන් 22න් සමන්විත පුස්තකාල උපදේශන කමිටුව පත්කිරීම සඳහා වූ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මෙම කමිටුව සඳහා ගරු නාගරික මන්ත්‍රී අකිළ එල්ලාවල මැතිතුමන් සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ගෙනා යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී. ප්‍රජා නියෝජනය වෙනුවෙන් සෝමපාළ නෙල්ලම්පිටිය මැතිතුමන් සුදුසු බව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමන් විසින් ගෙනා යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී. එහෙයින් 2019 වර්ෂය සඳහා වූ **පුස්තකාල උපදේශන කමිටුව ලෙස,**

**ගරු නාගරික මන්ත්‍රීවරුන් සහ මන්ත්‍රීවරියන්ගේ නියෝජනය**

1. ගරු නාගරික මන්ත්‍රිනී, එම්. ජී. ශාන්තිලේඛා මැතිතුමිය.
2. ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය.
3. ගරු නාගරික මන්ත්‍රිනී, එම්. සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය.
4. ගරු නාගරික මන්ත්‍රිනී, පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය.
5. ගරු නාගරික මන්ත්‍රි, ඩබ්. ඒ. නදීෂාන් ප්‍රදීප් ජයසේන මැතිතුමා.
6. ගරු නාගරික මන්ත්‍රි, කේ. ජී. පේමදාස මැතිතුමා.
7. ගරු නාගරික මන්ත්‍රි, එම්. ඩබ්. විමලසිරි මැතිතුමා.
8. ගරු නාගරික මන්ත්‍රි, ලාල් ගලප්පත්ති මැතිතුමා.
9. ගරු නාගරික මන්ත්‍රි, එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා.
10. ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා
11. ගරු නාගරික මන්ත්‍රි එම්. ජේ. මලීක්ෂා මැතිතුමා
12. ගරු නාගරික මන්ත්‍රි අකිළ එල්ලාවල මැතිතුමා

**ප්‍රජා නියෝජනය**

13. ටී. එම්. නෙයිසූර් මයා
14. ධර්මසේන සමරසිංහ මයා
15. එච්. ඒ. බී. අයි. සිරිවර්ධන මයා

16. එම්. ජී. එස්. ඩී. නාවනැල්ල මයා
17. ඉන්ද්‍රානි වීරසේකර මිය
18. අනිල් අල්විස් මයා
19. එම්. ජෙයරාජන් මයා
20. කුසුමා අබේසිංහ මිය
21. ඒ. එල්. අක්බර් අලී මයා
22. ඉන්ද්‍රානි එස්. රත්නායක මිය
23. දයානන්ද බෙනරගම මයා
24. සෝමපාල නෙල්ලම්පිටිය මයා

යන සාමාජිකයන්ගෙන් සැදුම්ලත් **පුස්තකාල උපදේශන කමිටුව** විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05፡01፡05 සංවර්ධන උපදේශන කමිටුව පත්කිරීම**

**1939 අංක 61 දරණ නගර සභා ආඥා පනතේ 29 (1) උප වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාරව සංවර්ධන උපදේශන කමිටුව පත්කිරීම**

බළන්ගොඩ නගර සභා සීමාව තුළ පවතින සියලු සංවර්ධන කටයුතු සඳහා සහ ගරු සභාවේ උන්නතිය, ආදායම් ඒකරාශි කිරීම/ආදායම් මාර්ග වැඩිදියුණු කිරීම ආදී සියලු සේවාවන් සඳහා උපදේශනය ලබාදීම, ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් බලතල ක්‍රියාත්මක කිරීම යන කරුණු උදෙසා

**ගරු නාගරික මන්ත්‍රීවරුන් සහ මන්ත්‍රීවරියන්ගේ නියෝජනය**

1. ගරු සභාපති, චමික ජයමිණි විමලසේන මැතිතුමා.
2. ගරු උප සභාපති, එම්. ටී. එම්. රුමි මැතිතුමා.
3. ගරු නාගරික මන්ත්‍රිනී, එම්. ජී. ශාන්තිලේඛා මැතිතුමිය.
4. ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය.
5. ගරු නාගරික මන්ත්‍රිනී, එම්. සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය.
6. ගරු නාගරික මන්ත්‍රිනී, පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය.

7. ගරු නාගරික මන්ත්‍රී, ඩබ්. ඒ. වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා.
8. ගරු නාගරික මන්ත්‍රී, ඩබ්. ඒ. නදීෂාන් ප්‍රදීප් ජයසේන මැතිතුමා.
9. ගරු නාගරික මන්ත්‍රී, කේ. ජී. ප්‍රේමදාස මැතිතුමා.
10. ගරු නාගරික මන්ත්‍රී, ඊ. ඒ. ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා.
11. ගරු නාගරික මන්ත්‍රී, එම්. ඩබ්. විමලසිරි මැතිතුමා.
12. ගරු නාගරික මන්ත්‍රී, ලාල් ගලප්පත්ති මැතිතුමා.
13. ගරු නාගරික මන්ත්‍රී, ඩබ්. එම්. නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා.
14. ගරු නාගරික මන්ත්‍රී, එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා.
15. ගරු නාගරික මන්ත්‍රී, එම්. නිමල් කරුණාරත්න මැතිතුමා.
16. ගරු නාගරික මන්ත්‍රී, එම්. ජේ. මලීක්ෂා මැතිතුමා.
17. ගරු නාගරික මන්ත්‍රී, අකිල සාලිය එල්ලාවල මැතිතුමා.

**ප්‍රජා නියෝජනය**

18. ගරු පූජ්‍ය කරගොඩ උයන්ගොඩ මෛත්‍රීමූර්ති ස්වාමීන් වහන්සේ
19. ගරු පූජ්‍ය පියනන්ද ස්වාමීන් වහන්සේ
20. ගරු පූජ්‍ය කඳන්ගොඩ සද්ධාතිස්ස ස්වාමීන් වහන්සේ
21. මුස්ලම් ප්‍රධාන පල්ලියේ පූජකතුමා
22. බළන්ගොඩ නගර සභාවේ හිටපු ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මහතා
23. විශ්‍රාමික විදුහල්පති එම්. ජෙයරාජන් මහතා
24. ආර්. කේ. ඩී. ජයසිංහ මහතා
25. ෆලීල් හාජියාර් මහතා
26. බී. එම්. ගුණතිලක මහතා
27. විල්ෆ්‍රඩ් සිසිල් මහතා
28. හර්ෂන හෙට්ටිආරච්චි මහතා
29. ග්‍රාම නිලධාරිනි චන්ද්‍රා පැලවත්ත මහත්මිය
30. නිහාල් ෆොන්සේකා මහතා
31. නිල්මිණි වනසේකර මහත්මිය

32. ඉන්ද්‍රානි රත්නායක මහත්මිය

33. මාග්‍රට් පෙරේරා මහත්මිය

යන සාමාජිකයන්ගෙන් සමන්විත සංවර්ධන උපදේශන කමිටුව පත් කිරීම සඳහා වූ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද අතර, එම යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**මෙහිදී සංවර්ධන උපදේශන කමිටුවේ ප්‍රජා නියෝජනය ලෙස,**

ගරු සභාපතිතුමන්ගේ යෝජනත්වයෙන් ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමන්ගේ යෝජනා ස්ථිරත්වයෙන් නගර සභාවේ විශ්‍රාමික වැඩ අධිකාරී දූළ බණ්ඩාර මැතිතුමන්ද, ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මාලික්ෂා මැතිතුමන්ගේ යෝජනත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රිනි පී.චන්ද්‍රලතා මැතිතුමියගේ යෝජනා ස්ථිරත්වයෙන් නෆීල් හාජියාර් මැතිතුමන්ද,ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමියගේ යෝජනත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රිනි පී.චන්ද්‍රලතා මැතිතුමියගේ යෝජනා ස්ථිරත්වයෙන් වෛද්‍ය සුනිල් මැතිතුමන්ද මෙහිදී පත්කර ගන්නා ලදී. විරෝධතා නොමැති හෙයින් මෙම සියළු සාමාජිකයන්ගෙන් සැදුම්ලත් කමිටුව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05:01:06 කාර්යාලයීය ප්‍රසම්පාදන කමිටුව**

රුපියල් 250,000.00 දක්වා කාර්යාලයීය ප්‍රසම්පාදන කමිටුව ලෙස,

1. ලේකම්,එස්.එච්.ඒ.කරුණාරත්න
2. ගණකාධිකාරී, එම්. ඩී. එස්. ප්‍රනාන්දු මයා
3. ප්‍රධාන කළමනාකරණ සහකාර, ජී. ඩී. ඒ. සේමපාල මිය
4. වැඩ අධිකාරී, එස්. එම්. සී. එස්. අබේසිරිවර්ධන මයා
5. පුස්තකාලාධිපති, එම්. මල්කාන්ති උඩවත්ත මිය
6. මහජන සෞඛ්‍ය පරීක්ෂක, කේ. එල්. බී. එල්. කුමාරසිංහ මයා
7. පෙර පාසල් පාලිකා, ටී. පී. එල්. බී. පෙරේරා මිය

8. ආයුර්වේද වෛද්‍ය නිලධාරිනි ඩබ්. ඩබ්. සධානා සංජීවනී පුෂ්පකුමාරි මිය

යන සාමාජිකයින්ගෙන් යුත් කාර්යාලයීය ප්‍රසම්පාදන කමිටු පත් කිරීම සඳහා වූ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී. විරෝධතා නොමැති හෙයින් ඉහත සාමාජිකයන්ගෙන් සැදුම්ලත් රුපියල් 250,000.00 දක්වා කාර්යාලයීය ප්‍රසම්පාදන කමිටුව ගරු සභාවේ ඒතමතිකව සම්මත විය.

**05:01:07 2019 වර්ෂයට අදාළව සභාව පවත්වන දිනය තීරණය කිරීම.**

2019 වර්ෂයට අදාළව සභාව පවත්වන දිනය තීරණය කිරීම සඳහා සුදුසු දිනයක් නම්කර ගන්නා ලෙස ගරු සභාපතිතුමන් විසින් සභාවට පවසා සිටින ලදුව ගරු නාගරික මන්ත්‍රි ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමන් විසින් සෑම මසකම දෙවන අඟහරුවාදා දින සභාව පැවැත්වීම සුදුසු බවට යෝජනා කරන ලදී.එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රි පී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05:01:08 කර්මාන්ත අංශයේ නඩත්තු වැඩ සටහන, මාර්ග නඩත්තු වැඩ සටහන අනුමත කිරීම (2019 මාසිකව කම්කරුවන් 25 කගේ සේවය මිලදී ගැනීමට අනුමැතිය ලබාගැනීම) .**

කර්මාන්ත අංශයේ නඩත්තු වැඩ සටහන, මාර්ග නඩත්තු වැඩ සටහන අනුමත කිරීම, 2019 වර්ෂය සඳහා මාසිකව කම්කරුවන් 25 කගේ සේවය මිලදී ගැනීමට අනුමැතිය ලබා ගැනීම සඳහා වූ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදී . ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් එය ස්ථිර කරන ලද අතර සභාවේ විරෝධතා නොමැති හෙයින් ඒකමතිකව සම්මත විය.

**05:01:09 2019 වාර්ෂික පුහුණු සැලැස්ම අනුමත කිරීම.**

2019 වාර්ෂික පුහුණු සැලැස්ම අනුමත කිරීම සඳහා වූ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රි එම්.ඩබ්.විමලසිරි මැතිතුමන්

විසින් එය ස්ථිර කරන ලදී. මේ සඳහා සභාවේ විරෝධතා නොමැති හෙයින් ඒකමතිකව සම්මත විය.

**05:01:10 2019 වර්ෂය සඳහා පහත නම් සඳහන් සේවකයින්ගේ සේවා ගිවිසුම් අලුත් කිරීමටත් ඔවුන් නැවත සේවය සඳහා බඳවා ගැනීමටත් අනුමැතිය ලබාගැනීම.**

01. අයි. ජයරාම් මයා - සුසානභූමි නඩත්තුකරු
02. ජී. හේමවංශ ගුණසේකර මයා - සුසානභූමි නඩත්තුකරු
03. ඩබ්. එල්. චන්ද්‍රසිරි තිලකරත්න මයා - සුසානභූමි නඩත්තුකරු
04. ඒ. තමිල් සෙල්වි මිය - පෙර පාසල් පාලිකා
05. කේ. රුවිනි නිරුක්ෂිකා මිය - පෙර පාසල් පාලිකා
06. කේ. නිල්මිණි ජයරත්න මිය - සෞඛ්‍ය කම්කරු
07. යූ. ඩී. සුගත් කුමාර මයා - සෞඛ්‍ය කම්කරු

2019 වර්ෂය සඳහා ඉහත නම් සඳහන් සේවකයින්ගේ සේවා ගිවිසුම් අලුත් කිරීමටත් ඔවුන් නැවත සේවය සඳහා බඳවා ගැනීමටත් අනුමැතිය ලබාගැනීම සඳහා ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මේ යටතේ අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමන් වැවේවත්ත පෙර පාසලේ සිංහල හා දෙමළ මාධ්‍යය දෙඅංශයටම අදාළ ළමුන් ඉගෙනගන්නා බැවින් එහි සේවය කරන ගුරුවරිය වෙනත් පෙර පාසල් සඳහා මාරුකිරීමෙන් දෙමළ ළමුන්ට අසාධාරණයක් වන බවත් ඉන් ජාතින් අතර සංහිඳියාව බිඳවැටීමට හේතු සාධක වන බවත් පවසා සිටින ලදී. ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් එම කරුණු සනාථ කරමින් අදහස් දක්වන ලදී.

ගරු සභාවේ විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව සභාවේ ඒකමතිකව සම්මත විය.

**05:01:11 2018 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු සඳහා පහත සඳහන් නිලධාරීන්ගෙන් සමන්විත භාණ්ඩ සමීක්ෂන මණ්ඩලය පත් කර ගැනීම සහ ඒ සඳහා මන්ත්‍රීන්වරු දෙදෙනෙක්ගේ නම් යෝජනා කර ගැනීම**

නිලධාරී නාමලේඛනය

| | | |
|---|---|---|
| අධීක්ෂණය | - | ගණකාධිකාරී, එම්. ඩී. එස්. ප්‍රනාන්දු මයා |
| සභාපති | - | ප්‍රධාන කළමනාකරණ සහකාර, ජී. ඩී. ඒ. සේමපාල මිය |
| සාමාජික | - | සංවර්ධන නිලධාරී, ඒ. රජිත් කොස්වත්ත මයා |
| සාමාජික | - | සංවර්ධන නිලධාරී, ඩී. ඩී. සුජාතා නීලකාන්ති මිය |
| සාමාජික | - | සංවර්ධන නිලධාරී, ටී. ජී. කේෂණී ප්‍රසදිකා විජේපාල මිය |
| සාමාජික | - | සංවර්ධන නිලධාරී, චතුලියා කල්හාරී දෙනිපිටිය මිය |
| සාමාජික | - | සංවර්ධන නිලධාරී, එම්. ආර්. එම්. රසිකා සෙව්වන්දි මිය |
| සාමාජික | - | සංවර්ධන නිලධාරී, ඒ. එම්. සංජී වසන්ති මිය |
| සාමාජික | - | සංවර්ධන නිලධාරී, රසිකා නිල්මිණි මීගස්දෙණිය මිය |
| සාමාජික | - | කළමනාකරණ සහකාර, එම්. සෙල්වරාණි මිය |
| සාමාජික | - | කළමනාකරණ සහකාර, ජේ. එම්. ගීතා ධනංජනී මෙනවිය |
| සාමාජික | - | කළමනාකරණ සහකාර, එල්. ඩී. සජිත් ශානක මයා |

2018 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු සඳහා ඉහත සඳහන් නිලධාරීන්ගෙන් සමන්විත භාණ්ඩ සමීක්ෂන මණ්ඩලය පත් කර ගැනීම සහ ඒ සඳහා මන්ත්‍රීන්වරු දෙදෙනෙක්ගේ නම් යෝජනා කර ගැනීම සඳහා වූ යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ජී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් එය ස්ථිර කරන ලදී.

මෙහිදී 2018 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු සඳහා මන්ත්‍රීන්වරු දෙපළ ලෙස ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමන්ගේ යෝජනත්වයෙන්,ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමන්ගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමන්ද , ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර කව්රත්න මැතිතුමන්ගේ යෝජනත්වයෙන් ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමියගේ යෝජනා ස්ථිරත්වයෙන් එම්.ඩබ්.විමලසිරි මැතිතුමන්ද පත්කරගන්නා ලදී.

විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05:01:12 කඩකාමරවල තක්සේරුව ක්‍රියාත්මක කිරීම.**

2018. 11. 08 දින පැවති සභාවේදී පොදු වෙළෙඳසැල කඩකාමර තක්සේරුව ක්‍රියාත්මක කිරීම සම්බන්ධ ගනු ලැබූ තීරණ පිළිබඳ නැවත සාකච්ඡා කිරීම සඳහා වූ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර මෙහිදී තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ලබාදී ඇති තක්සේරුවක් ක්‍රියාත්මක නොකර සිටිමේදී අධිභාර දූරීමට සිදුවිය හැකි බව අදාළ නිළධාරින් විසින් පෙන්වා දී ඇති බව ගරු සභාපතිතුමන් විසින් සභාවට පවසා සිටින ලදී. මෙහිදී ගරු සභාවේ බහුතර අදහස වූයේ දූනට පොදු වෙළෙද සැල භාවිතා කල නොහැකි මට්ටමින් දිරාපත් වී ඇති බැවින් , ජනතාවගේ පැමිණීම අවම වී ඇති බැවින් හා කඩ හිමියන් කඩ කාමර ආපසු භාර දීමට පෙළඹී ඇති බැවින්ද තක්සේරුව ක්‍රියාත්මක කිරීම කිසිදු ආකාරයකින් සාධාරන නොවන බවත් දූනට පවතින තක්සේරුව ක්‍රියාත්මක කිරීම යෝග්‍ය වන බවයි.

**එහෙයින් සභාවේ ඉදිරිපත් වූ සභික අදහස් සළකා බලා ගරුඋප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින්** පොදු වෙළෙඳසැල කඩකාමර තක්සේරුව ක්‍රියාත්මක නොකිරීමට යෝජනා කරන ලද අතර, එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී. මෙහිදී පොදු වෙළෙද සැල සඳහා නව ගොඩනැගිල්ල ඉදිකිරීම සිදු කරන තෙක් සාමාන්‍ය අළුත්වැඩියාවක් සිදුකර පරිහරනයට සරිලන පරිදි සකස් කිරීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් පවසා සිටින ලදී.

පොදු වෙළෙඳසැල කඩකාමර තක්සේරුව ක්‍රියාත්මක නොකිරීම සම්බන්ධයෙන් සභාවේ විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් එම යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05:01:13 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සඳහා අනුමැතිය ලබාගැනීම**

2019 වර්ෂය සඳහා වූ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුමැතිය ලබාගැනීම සඳහා ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05:01:14 වීථි පහන් නඩත්තු සැලැස්ම සඳහා අනුමැතිය ලබා ගැනීම**

2019 වර්ෂය සඳහා වූ වීථි පහන් නඩත්තු සැලැස්මට අනුමැතිය ලබාගැනීම සඳහා ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05:01:15 වැසිජල කාණු නඩත්තු සැලැස්ම සඳහා අනුමැතිය ලබා ගැනීම**

2019 වර්ෂය සඳහා වූ වැසිජල කාණු නඩත්තු සැලැස්මට අනුමැතිය ලබාගැනීම සඳහා ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05:01:16 වටරවුම් නඩත්තු සැලැසුම සඳහා අනුමැතිය ලබා ගැනීම.**

2019 වර්ෂය සඳහා වූ වටරවුම් නඩත්තු සැලැස්මට අනුමැතිය ලබාගැනීම සඳහා ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05:01:17 ඝණ අපද්‍රව්‍ය කළමනාකරන සැලැස්ම සඳහා අනුමැතිය ලබා ගැනීම.**

**( සෞඛ්‍යය කම්කරුවන් 15 දෙනෙකුගේ සේවය මාසිකව මිලදී ගැනීමට අනුමැතිය ලබා ගැනීම)**

ඝණ අපද්‍රව්‍ය කළමනාකරන සැලැස්ම සඳහා අනුමැතිය ලබා ගැනීම හා සෞඛ්‍යය කම්කරුවන් 15 දෙනෙකුගේ සේවය මාසිකව මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීම සඳහා වූ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05:01:18 වීරී ඇමදීමේ සැලැස්ම සඳහා අනුමැතිය ලබා ගැනීම.**

2019 වර්ෂය සඳහා වූ වීරී ඇමදීමේ සැලැස්මට අනුමැතිය ලබාගැනීම සඳහා ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05:01:19 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ සබරගමුව පළාත් සභාව විසින් වැළඳ ගන්නා ලද සම්මත අතුරු ව්‍යවස්ථාව නගර සභා බල සීමාව තුල ක්‍රියාත්මක කිරීම සඳහා වැළඳ ගැනීමට අනුමැතිය ලබාගැනීම.**

1952 අංක 06 දරණ පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ සබරගමුව පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යතුමා විසින් සකස්කර 2013.06.28 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ I(අ) කොටසේ පල කරන ලද ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා කෙටුම්පත නගර සභා බල සීමාව තුල ක්‍රියාත්මක කිරීම සඳහා වැළඳ ගැනීමට අනුමැතිය ලබාගැනීම සඳහා වූ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05:01:20 නගර සභාව සතු වාහන රක්ෂණය කිරීම සඳහා ලැබී ඇති මිල ගණන් අනුව රක්ෂණ සමාගමක් තෝරා ගැනීම**

නගර සභාව සතු වාහන රක්ෂණය කිරීම සඳහා ලැබී ඇති මිල ගණන් අනුව රක්ෂණ සමාගමක් තෝරා ගැනීම සඳහා වූ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර සභාවේ ගරු සභික අදහස් විමසීමෙන් පසුව අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති ජාතික රක්ෂණ භාර අරමුදල වෙත සභාව සතු වාහන රක්ෂණය කිරීම සඳහා ලබාදීම සුදුසු බවට යෝජනා කරන ලදී.එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

05෴01෴21 **නාගරික සංවර්ධන අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය යටතේ ඉදි කරන ලද (ADB/1632 SR(SF] උප ව්‍යාපෘති අංක 4121) වැසි ජල කාණු පද්ධතිය ඉදි කිරීමට අදාල ණය මුදල වාරික 112 කින් ගෙවීමට අනුමැතිය ලබාගැනීම.**

නාගරික සංවර්ධන අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය යටතේ ඉදි කරන ලද (ADB/1632 SR(SF] උප ව්‍යාපෘති අංක 4121) වැසි ජල කාණු පද්ධතිය ඉදි කිරීමට අදාල ණය මුදල වාරික 112 කින් ගෙවීමට අනුමැතිය ලබාගැනීම සඳහා වූ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

05෴01෴22 **විශ්ව විද්‍යාල සිසුන්ට ශිෂ්‍යත්ව ලබා දීමේ නාම ලේඛන ඉදිරිපත් කිරීම හා ඒ සඳහා අනුමැතිය ලබා ගැනීම.**

විශ්ව විද්‍යාල සිසුන්ට ශිෂ්‍යත්ව ලබා දීමේ නාම ලේඛන ඉදිරිපත් කිරීම හා ඒ සඳහා අනුමැතිය ලබා ගැනීම  සඳහා වූ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර එම යෝජනාව ගරු උපසභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී. මෙහිදී එම නාමලේඛනය සඳහා ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමාගේ යෝජනත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමන්ගේ යෝජනා ස්ථිරත්වයෙන්  පී.පී.දිලංකා තරින්දි සිසුවියගේ හා ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමාගේ යෝජනත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමියගේ යෝජනා ස්ථිරත්වයෙන්  භාග්‍යා මධුෂානි විමළසිරි සිසුවියගේ නම මෙම නාම ලේඛනය සඳහා ඇතුළත් කරන ලදී. විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

05෴01෴23 **වැසිකිළි ආධාර ලබා දීමේ නාම ලේඛනය සඳහා අනුමැතිය ලබා ගැනීම**

නගර සභා සෞඛ්‍යය අංශය වෙත ලබාදී ඇති ඉල්ලීම් සලකා වැසිකිළි ආධාර ලබා දීමට සුදුසු යයි සකස්කරන ලද නාම ලේඛනය සහිත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් එය ස්ථිර කරන ලදී. මෙහිදී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.පී.වීරසිංහ මැතිතුමන්ගේ යෝජනත්වයෙන් ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමන්ගේ යෝජනා

ස්ථිරත්වයෙන් කේ.පී. රෂ්මි මල්ලිකා මහත්මිය හා ඩබ්.දර්ශනි වර්දරාජ් මහත්මියගේ නම් මෙම නාම ලේඛනය සඳහා එකතු කරන ලදී. විරෝධතා නොමැති හෙයින් වැසිකිළි ආධාර ලබා දීමේ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05:01:24 අභ්‍යන්තර විගණන සැලැස්ම අනුමත කර ගැනීම**

2019 වර්ෂය සඳහා වූ අභ්‍යන්තර විගණන සැලැස්මට අනුමැතිය ලබාගැනීම සඳහා ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05:01:25 වැය මාරු කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම**

2019 වර්ෂය සඳහා **වැය** මාරු කිරීම සඳහා අනුමැතිය ලබාගැනීම සඳහා ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05:01:26 ආයතනයේ ගෙවීම් සම්බන්ධ මු.රෙ. 83 යටතේ නිලධාරීන්ට බලතල පැවරීම**

2019 වර්ෂයේ ආයතනයේ ගෙවීම් සම්බන්ධ මු.රෙ. 83 යටතේ නිලධාරීන්ට බලතල පැවරීම සඳහා අනුමැතිය ලබාගැනීම සඳහා ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05:01:27 බස් නැවතුම්පළ අංක C - 9 දරණ කඩ කාමරයේ බදු අයිතිය වෙනස් කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම.**

බස් නැවතුම්පළ අංක C - 9 දරණ කඩ කාමරයේ බදු අයිතිය වෙනස් කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම සඳහා වූ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාව වෙත ඉදිරිපත් කරන ලද අතර ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී .මේ සඳහා විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05ඃ01ඃ28 පොදු වෙළඳසැල අංක 7 කඩ කාමරය නගර සභාවට නැවත භාර දී ඇති බැවින් ඒ සම්බන්ධ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම**

පොදු වෙළඳසැල අංක 7 කඩ කාමරය නගර සභාවට නැවත භාර දී ඇති බැවින් එම කඩකාමරය නැවත ටෙන්ඩර් කර ගැනුම්කරුවෙකු තෝරා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද යොජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී .මේ සඳහා විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05ඃ01ඃ29 රථවාහන නැවතීමේ ගාස්තු ටෙන්ඩරයේ නිවාඩු දින සඳහා ගාස්තු නිදහස් කර ගැනිම**

රථවාහන නැවතීමේ ගාස්තු ටෙන්ඩරයේ නිවාඩු දින සඳහා ගාස්තු නිදහස් කර දෙන මෙන් අදාළ ගිවිසුම්කරු විසින් කරන ලද ඉල්ලීම ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදී. මෙහිදී මේ පිළිබඳ ගරු සභාවේ සාකච්ඡා කිරීමෙන් අනතුරුව 2019 වර්ෂයේ සෑම පොහොය දිනක්ම,අප්‍රේල් මස 13,14,15 සහ මැයි 01 වන දින ඇතුළු දින 16 ක් රථවාහන නැවතීමේ ගාස්තු ටෙන්ඩරයේ නිවාඩු දින සඳහා ගාස්තු නිදහස් කිරීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.මෙම යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමන් විසින් අදහස් දක්වමින් රථවාහන නැවතීමේ ගාස්තු ටෙන්ඩරයේ නිවාඩු දින සඳහා ගාස්තු නිදහස් කිරීම සම්බන්ධයෙන් රථහිමියන්ගේ දැනුවත්වීම සඳහා එම දින ප්‍රදර්ශනය කරන ලෙස පවසා සිටින ලදී.

**05ඃ01ඃ30 නගර සභා ක්‍රීඩා කන්ඩායම සඳහා අවශ්‍ය ඇඳුම් කට්ටලයේ කලිසම් කොටස සභාවේ වියදමින් ලබාගැනීමට අනුමත කිරීම.**

නගර සභා ක්‍රීඩා කන්ඩායම සඳහා අවශ්‍ය ඇඳුම් කට්ටලයේ කලිසම් කොටස සභාවේ වියදමින් ලබාගැනීමට අනුමැතිය පතමින් ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමළසිරි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05:01:31 ඝන අපද්‍රව්‍යය කළමණාකරන මධ්‍යස්ථානයේ පැති බැම්ම ඉදිරිකිරීමේ ප්‍රමාද ගාස්තු කපා හැරීම**

ඝන අපද්‍රව්‍යය කළමණාකරන මධ්‍යස්ථානයේ පැති බැම්ම ඉදිරිකිරීමේ කර්මාන්තය නියමිත දිනට නිම කිරීමට නොහැකි වූ බැවින් ප්‍රමාද ගාස්තු ගෙවීමට සිදුවන බැවින් එහි කොන්ත්‍රාත් කාල සීමාව දිගු කර දෙන සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරිය විසින් ඉදිරපත් කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදී. මෙහිදී ගරු සභාවේ සාමුහික අදහස වූයේ මේ සඳහා අනුමැතිය ලබාදිය නොහැකි යන්නයි.

එහෙයින් ගරු සභාපතිතුමන් විසින් ඝන අපද්‍රව්‍යය කළමණාකරන මධ්‍යස්ථානයේ පැති බැම්ම ඉදිරිකිරීමේ කර්මාන්තය නියමිත දිනට නිම කිරීමට නොහැකි වූ බැවින් ප්‍රමාද ගාස්තු අයකිරිම කපා හැරීම කල නොහැකි බවත් එහි කොන්ත්‍රාත් කාල සීමාව දිගු නොකිරීමටත් ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලද අතර එම යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී. විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

05:02 **ඇස්තමේන්තු අනුමත කිරීම**

05:02:01. දෙහිගස්තලාව දෙවන පටුමග තාර යොදා සංවර්ධනය කිරීම - රු. 1,000,000.00

දෙහිගස්තලාව දෙවන පටුමග තාර යොදා සංවර්ධනය කිරීම රු. 1,000,000.00 ඇස්තමේන්තු මුදලක් යටතේ සිදුකිරීම සඳහා ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

05:02:02 මුගුණමලේ සුසාන භූමි මාර්ගය කොන්ක්‍රීට් අතුරා සහ පඩි යොදා සංවර්ධනය කිරීම.රු.760,000.00

මුගුණමලේ සුසාන භූමි මාර්ගය කොන්ක්‍රීට් අතුරා සහ පඩි යොදා සංවර්ධනය කිරීම රු. 760,000.00 ක ඇස්තමේන්තු මුදලක් යටතේ සිදුකිරීම සඳහා ගරු සභාපතිතුමන්

විසින් සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

05෴02෴03 පරගහ අරාව ගොඩහේන මාර්ගය කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම - රු. 562,000.00

පරගහ අරාව ගොඩහේන මාර්ගය කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම රු. 562,000.00 ක ඇස්තමේන්තු මුදලක් යටතේ සිදුකිරීම සඳහා ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

05෴02෴04 කිවුලෙවෙල නිවාස යෝජනා ක්‍රමය තුළ මාර්ගයක් සකස් කර ගැනීම සඳහා රැඳවුම් බැම්ම ඉදිකිරීම - රු. 400,000.00

කිවුලෙවෙල නිවාස යෝජනා ක්‍රමය තුළ මාර්ගයක් සකස් කර ගැනීම සඳහා රැඳවුම් බැම්ම ඉදිකිරීම රු. 400,000.00 ක ඇස්තමේන්තු මුදලක් යටතේ සිදුකිරීම සඳහා ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

05෴02෴05 සුදර්ශනගම පළමු පටුමග රැඳවුම් බැම්ම ඉදිකිරීම - රු. 300,000.00

සුදර්ශනගම පළමු පටුමග රැඳවුම් බැම්ම ඉදිකිරීම රු. 300,000.00 ක ඇස්තමේන්තු මුදලක් යටතේ සිදුකිරීම සඳහා ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

05෴02෴06 කුමාරගම හොරකන්වල මාර්ගයේ (සංඝබෝධි) වැසිජල කාණු කොටසක් ඉදිකිරීම - රු. 300,000.00

කුමාරගම හොරකන්වල මාර්ගයේ (සංඝබෝධි) වැසිජල කාණු කොටසක් ඉදිකිරීම රු. 300,000.00 ක ඇස්තමේන්තු මුදලක් යටතේ සිදුකිරීම සඳහා ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

05ඃ02ඃ07 උඩ ඇල්ලෙපොල මූකලන්වත්ත පඩි සහිත මාර්ගයේ වැසිජල කාණු කොටසක් ඉදිකිරීම - රු. 118,000.00

උඩ ඇල්ලෙපොල මූකලන්වත්ත පඩි සහිත මාර්ගයේ වැසිජල කාණු කොටසක් ඉදිකිරීම රු. 118,000.00 ක ඇස්තමේන්තු මුදලක් යටතේ සිදුකිරීම සඳහා ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

05ඃ02ඃ**08** පල්ලෙකුඹුර මාර්ගයේ වැසිජල කාණු කොටසක් ඉදිකිරීම - රු. 182,000.00

පල්ලෙකුඹුර මාර්ගයේ වැසිජල කාණු කොටසක් ඉදිකිරීම රු. 182,000.00 ක ඇස්තමේන්තු මුදලක් යටතේ සිදුකිරීම සඳහා ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

05ඃ02ඃ**09** කුමාරගම හොරකන්වල මාර්ගයේ (සංඝබෝධි) පළමු රැඳවුම් බැම්ම ඉදිකිරීම - රු. 200,000.00

කුමාරගම හොරකන්වල මාර්ගයේ (සංඝබෝධි) පළමු රැඳවුම් බැම්ම ඉදිකිරීම රු. 200,000.00 ක ඇස්තමේන්තු මුදලක් යටතේ සිදුකිරීම සඳහා ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

05ඃ02ඃ10 ඕලුගංතොට සෙලෝවත්ත මාර්ගයේ වැසිජල කාණු කොටසක් ඉදිකිරීම රු. 300,000.00

ඕලුගංතොට සෙලෝවත්ත මාර්ගයේ වැසිජල කාණු කොටසක් ඉදිකිරීම රු. 300,000.00 ක ඇස්තමේන්තු මුදලක් යටතේ සිදුකිරීම සඳහා ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

05ඃ02ඃ11 සුබහිර් අලීම් මාවත වැසිජල කාණු කොටසක් ඉදිකිරීම - රු. 300,000.00

සුබහිර් අලීම් මාවත වැසිජල කාණු කොටසක් ඉදිකිරීම රු. 300,000.00 ක ඇස්තමේන්තු මුදලක් යටතේ සිදුකිරීම සඳහා ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

05ඃ02ඃ12 සුබහිර් අලීම් මාවත දෙවන පටුමග කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම - රු. 400,000.00

සුබහිර් අලීම් මාවත දෙවන පටුමග කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම රු. 400,000.00 ක ඇස්තමේන්තු මුදලක් යටතේ සිදුකිරීම සඳහා ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

05ඃ02ඃ13 උඩකන්ද මාර්ගයේ කාණු කොටසක් සඳහා කොන්ක්‍රීට් ආවරණය යෙදීම රු. 300,000.00

උඩකන්ද මාර්ගයේ කාණු කොටසක් සඳහා කොන්ක්‍රීට් ආවරණය යෙදීම රු. 300,000.00 ක ඇස්තමේන්තු මුදලක් යටතේ සිදුකිරීම සඳහා ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

05ඃ02ඃ14 තානායම් මාර්ගයේ රුඳවුම් බැම්ම ඉදිකිරීම - රු. 500,000.00

තානායම් මාර්ගයේ රැඳවුම් බැම්ම ඉදිකිරීම රු. 500,000.00 ක ඇස්තමේන්තු මුදලක් යටතේ සිදුකිරීම සඳහා ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

05ඃ02ඃ15 ඕලුගංතොට ගංගාරාම මාර්ගයේ බැම්ම ඉදි කිරිම - රු. 215,000.00

ඕලුගංතොට ගංගාරාම මාර්ගයේ බැම්ම ඉදි කිරිම රු. 215,000.00 ක ඇස්තමේන්තු මුදලක් යටතේ සිදුකිරීම සඳහා ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

05ඃ02ඃ16 තොසිල ගාර්ඩන් මාර්ගය කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම - රු. 380,000.00

තොසිල ගාර්ඩන් මාර්ගය කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම රු. 380,000.00 ක ඇස්තමේන්තු මුදලක් යටතේ සිදුකිරීම සඳහා ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

05ඃ02ඃ17 බලගහමුල නාන ළිඳ පරිශ්‍රයේ රැඳවුම් බැම්ම ඉදිකිරීම රු. 360,000.00

බලගහමුල නාන ළිඳ පරිශ්‍රයේ රැඳවුම් බැම්ම ඉදිකිරීම රු. 360,000.00 ක ඇස්තමේන්තු මුදලක් යටතේ සිදුකිරීම සඳහා ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

05ඃ02ඃ18 දොරවෙල පඩි සහිත මාර්ගය බැමි සහ පඩි යොදා සංවර්ධනය කිරීම රු. 90,000.00

දොරවෙල පඩි සහිත මාර්ගය බැමි සහ පඩි යොදා සංවර්ධනය කිරීම රු. 90,000.00 ක ඇස්තමේන්තු මුදලක් යටතේ සිදුකිරීම සඳහා ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

05෴02෴19 මහමෙව්නා අතුරු මාර්ගය කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම රු. 238,000.00

මහමෙව්නා අතුරු මාර්ගය කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම රු. 238,000.00 ක ඇස්තමේන්තු මුදලක් යටතේ සිදුකිරීම සඳහා ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

05෴02෴20 මැද කිරිඳිගල ශෛලතලාරාම මාර්ගය කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම රු. 245,000.00

මැද කිරිඳිගල ශෛලතලාරාම මාර්ගය කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම රු. 245,000.00 ක ඇස්තමේන්තු මුදලක් යටතේ සිදුකිරීම සඳහා ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

05෴02෴21 තානායම් ගෙදර වත්ත මාර්ගයට විරුද්ධ පස මාර්ගයේ අවසන් කොටස වැසිජල කාණුව ඉදිකිරීම රු. 176,000.00

තානායම් ගෙදර වත්ත මාර්ගයට විරුද්ධ පස මාර්ගයේ අවසන් කොටස වැසිජල කාණුව ඉදිකිරීම රු. 176,000.00 ක ඇස්තමේන්තු මුදලක් යටතේ සිදුකිරීම සඳහා ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

05෴02෴22 වැලිහරනාව ජල ටැංකිය මාර්ගයේ පළමු පටුමග වැසිකජල කාණු කොටසක් ඉදිකිරීම රු. 70,000.00

වැලිහරනාව ජල ටැංකිය මාර්ගයේ පළමු පටුමග වැසිකජල කාණු කොටසක් ඉදිකිරීම රු. 70,000.00 ක ඇස්තමේන්තු මුදලක් යටතේ සිදුකිරීම සඳහා ගරු සභාපතිතුමන්

විසින් සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

05ඃ02ඃ23 දෙහිගස්තලාව තලාව මාර්ගයෙන් ආරම්භ වන පටුමග වැසිජල කාණු කොටසක් ඉදිකිරීම රු. 113,000.00

දෙහිගස්තලාව තලාව මාර්ගයෙන් ආරම්භ වන පටුමග වැසිජල කාණු කොටසක් ඉදිකිරීම රු. 113,000.00 ක ඇස්තමේන්තු මුදලක් යටතේ සිදුකිරීම සඳහා ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

05ඃ02ඃ24 වැවේ ළිඳ මාර්ගයේ වැසිජල කාණුව ඉදිකිරීම රු. 498,000.00

වැවේ ළිඳ මාර්ගයේ වැසිජල කාණුව ඉදිකිරීම රු. 498,000.00 ක ඇස්තමේන්තු මුදලක් යටතේ සිදුකිරීම සඳහා ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

05ඃ02ඃ25 රිෂානා සර්විස් ඉහල මාර්ගය කොන්ක්‍රීට් කිරීම. රු. 300,000.00

රිෂානා සර්විස් ඉහල මාර්ගය කොන්ක්‍රීට් කිරීම රු. 300,000.00 ක ඇස්තමේන්තු මුදලක් යටතේ සිදුකිරීම සඳහා ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

05ඃ02ඃ26 සුනන්දාරාමය මාවතට ජලය ලබාදීම. රු. 251,590.00

සුනන්දාරාමය මාවතට ජලය ලබාදීම රු. 251,590.00 ක ඇස්තමේන්තු මුදලක් යටතේ සිදුකිරීම සඳහා ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

05෴02෴27 වැ කුඹුර කොටුගොඩැල්ල ගමට පානීය ජලය ලබාදීම. රු. 419,000.00

වැ කුඹුර කොටුගොඩැල්ල ගමට පානීය ජලය ලබාදීම. රු. 419,000.00 ක ඇස්තමේන්තු මුදලක් යටතේ සිදුකිරීම සඳහා ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමී මැතිතුමන් විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

05෴02෴28 ඉහත කර්මාන්ත ඉටුකිරීම සඳහා සුදුසු සමිති තෝරා ගැනීම.

ඉහත කර්මාන්ත ඉටුකිරීම සඳහා සුදුසු සමිති තෝරා ගැනීම සඳහා වූ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර,ගරු උප සභාපති එම්.ටී.එම්.රුමී මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී. මේ සඳහා විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

## 06. මන්ත්‍රී යෝජනා

*06෴01 ගරු නාගරික මන්ත්‍රී අකිල සාලිය එල්ලාවල මැතිතුමා*

**06෴01෴01 උඩ ඇල්ලෙපොළ මාළිගාතැන්න කුෂන් කඩය ඉදිරිපිට කේ.ඩබ්.තුෂාර මහතාගේ නිවස දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරීම සඳහා රු.150,000.00 ක් ප්‍රතිපාදන වෙන්කරගැනීම.**

ගරු නාගරික මන්ත්‍රී අකිල සාලිය එල්ලාවල මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රී වසන්ත ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. මෙහිදී උඩ ඇල්ලෙපොළ මාළිගාතැන්න කුෂන් කඩය ඉදිරිපිට කේ.ඩබ්.තුෂාර මහතාගේ නිවස දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරීම සඳහා සභාවේ සෘජු ශ්‍රමය යොදාගෙන සිදු කිරීමට මෙහිදී සාකච්ඡා කෙරුන අතර මේ සඳහා විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

මින්පසු ප.ව. 1.35 ට පමණ ගරු නාගරික මන්ත්‍රී අකිල සාලිය එල්ලාවල මැතිතුමා ගරු සභාවෙන් පිටව යන ලදී.

***06ඃ02 ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.පී.වීරසිංහ මැතිතුමා***

06ඃ02ඃ01 වැසීයන පොදු වෙළෙඳ සැල කඩිනමින් නවීකරණය කිරීම.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.පී.වීරසිංහ මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද වැසීයන පොදු වෙළෙඳ සැල කඩිනමින් නවීකරනය කිරීමේ යෝජනාව ගරු නාගරික මන්ත්‍රි නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී. මේ සම්බන්ධව කඩිනම් පියවරක් ගැනීමට ගරු සභාපතිතුමන් එකග වූ අතර මේ සඳහා විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රි ඩබ්.එම්.එන්.පී.වීරසිංහ මැතිතුමා විසින් අදහස් දක්වමින්,පසුගිය කාල වකවානුව තුළ සභාවට කීර්ති නාමයක් අත්කර දිය හැකි සෑම කටයුත්තකටම තම දායකත්වය නොමසුරුව ලබාදී ඇති බවත්, සභාව වෙත නගරයට විශාල කාර්යය භාර්යයක් සිදු කර ඇති බවත් පවසා සිටි අතර ඉදිරයේදි නගරයේ සෑම මන්ත්‍රිවරයෙක් සඳහාම ප්‍රතිපාදන සාධාරණව බෙදීයන ආකාරයට සංවර්ධන කාර්යයන් ඉටුකරනු ඇතැයි අපේක්ෂා කරන බවද පවසා සිටින ලදී. එමෙන්ම එළඹෙන නව වසරේ ගරු සභාපතිතුමන් ඇතුළු කාර්යය මණ්ඩලයට සභාවේ කාර්යයන් කරගෙන යාමට අවශ්‍ය ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරන බව පවසා සිටි

ගරු නාගරික මන්ත්‍රි ඩබ්.එම්.එන්.පී.වීරසිංහ මැතිතුමා ප.ව. 1.45 ට පමණ ගරු සභාවෙන් පිටව යන ලදී. මෙම අවස්ථාවේ ගරු නාගරික මන්ත්‍රි ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමන්ද සභා ගර්භයෙන් පිටත්ව යන ලදී.

***06ඃ03 ගරු නාගරික මන්ත්‍රි නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා***

06ඃ03ඃ01 නගර සභාවට අයත් පොදු වෙළෙඳසැල (සාප්පු කඩ) නව බස් නැවතුම්පළ කීමනි කඩ කාමරවල කුළිය සංශෝධනය කිරීම සඳහා සබරගමුව පළාත් ආණ්ඩුකාරතුමිය වෙත යවන ලද ලිපියේ ප්‍රගතිය විමසීම.

06ඃ03ඃ02 පල්ලෙවෙල වෙළ අද්දර මාර්ගයේ නගර සභාව වෙත පවරා ඇති කොටස ඉදිරියේදි ක්‍රමවත්ව සංවර්ධනය කරන තුරු තාවකාලිකව නඩත්තු කටයුතු කිරීම.

06ඃ03ඃ03 වැවවත්ත උද්‍යානය,වැවවත්ත වතු නිවාස සහ පල්ලෙවෙල යන ප්‍රදේශවල ඩෙංගු උණ රෝගීන් කිහිප දෙනෙකු වාර්තා වී ඇති බැවින් ඒ පිළිබඳව නගර සභාවේ අවධානය යොමුකිරීම.

06ඃ03ඃ04 2019 වර්ෂයේ පළමු වසරට ඇතුළත් කිරීමට බලාපොරොත්තු නගර සභා සීමාවේ ස්ථිර පදිංචි දරු දූරියන්ට සිදුවන අසාධාරණය පිළිබඳව නගර සභාවේ අවධානය යොමුකිරීම.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී. මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ගරු සභාවට අයත් පොදු වෙළෙඳසැල (සාප්පු කඩ) නව බස් නැවතුම්පළ කීමනි කඩ කාමරවල කුළිය සංශෝධනය කිරීම සඳහා සබරගමුව පළාත් ආණ්ඩුකාරතුමිය වෙත යවන ලද ලිපියේ ප්‍රගතිය විමසා සිටි අතර ගරු සභාපතිතුමන් විසින් මේ වන විට එම ලිපිය ගරු ආණ්ඩුකාරතුමිය වෙත යවා ඇති බව පවසා සිටින ලදී.

එමෙන්ම පල්ලෙවෙල වෙළ අද්දර මාර්ගයේ නගර සභාව වෙත පවරා ඇති කොටස ඉදිරියේදි ක්‍රමවත්ව සංවර්ධනය කරන තුරු තාවකාලිකව නඩත්තු කටයුතු සිදු කර මාර්ගය ගමන් කල හැකි පරිදි සකසා දෙන ලෙස ඉල්ලා සිටි ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් වැවවත්ත උද්‍යානය,වැවවත්ත වතු නිවාස සහ පල්ලෙවෙල යන ප්‍රදේශවල ඩෙංගු උණ රෝගීන් කිහිප දෙනෙකු වාර්තා වී ඇති බවත්,එම ප්‍රදේශයේ වතුර බැස යාමේ ගැටළුවක් පවතින හෙයින් සැම විටම වතුර පිරීඇති බව දක්නට ලැබෙන බවත් ඒ සඳහා සුදුසු පිළියමක් සභාව මැදිහත්ව ක්‍රියාත්මක කරන ලෙසත් ඉල්ලා සිටින ලදී. 2019 වර්ෂයේ පළමු වසරට ඇතුළත් කිරීමට බලාපොරොත්තු නගර සභා සීමාවේ ස්ථිර පදිංචි දරු දූරියන්ට සිදුවන අසාධාරණය පිළිබඳව නගර සභාවේ අවධානය යොමුකරන ලෙස පවසා සිටි ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් 2019 වර්ෂයට එකදු පාසලක්වත් හිමි නොවූ නගර සභා සීමාවේ ස්ථිර පදිංචි දරුවන් සිටිම ශෝචනීය තත්වයක් බවත් පවසා සිටින ලදී.

මේ සඳහා විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

***06ඃ04 ගරු නාගරික මන්ත්‍රිනි පී. චන්ද්‍රලතා මැතිතුමිය***

06ඃ04ඃ01 ශ්‍රී සුදර්ශනගම ගම්වාසීන්ට ජලසම්පාදනය මගින් ජලය ලබාදීමේදි මාර්ගය පළුදු කිරීම නිසා මාර්ගය කැඩී විනාශ වී ඇතිබැවින් නැවත එය ප්‍රතිසංස්කරණය කරන ලෙස ඉල්ලා සිටීම.

06ඃ04ඃ02 හුණුකුඹුර එගොඩ මාර්ගයේ කොටසක කාණු පද්ධතිය සම්පූර්ණයෙන්ම අවහිර වී ඇති බැවින් මාර්ගය විනාශ වී කැඩී ගොස් ඇති බැවින් කාණු පද්ධතිය ශුද්ධ කර නැවත යථා තත්වයට පත්කර දෙන මෙන් ඉල්ලා සිටීම.

ගරු නාගරික මන්ත්‍රිනි පී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රි කේ.පී.පේමදාස මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී. මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රිනි පී. චන්ද්‍රලතා මැතිතුමිය ශ්‍රී සුදර්ශනගම ගම්වාසීන්ට ජලසම්පාදනය මගින් ජලය ලබාදීමේදි මාර්ගය පළුදු කිරීම නිසා මාර්ගය කැඩී විනාශ වී ඇතිබැවින් නැවත එය කඩිනමින් ප්‍රතිසංස්කරණය කරන ලෙස ඉල්ලා සිටි අතර, හුණුකුඹුර එගොඩ මාර්ගයේ කොටසක කාණු පද්ධතිය සම්පූර්ණයෙන්ම අවහිර වී ඇති බැවින් මාර්ගය විනාශ වී කැඩී ගොස් ඇති බැවින් කාණු පද්ධතිය ශුද්ධ කර නැවත යථා තත්වයට පත්කර දෙන මෙන් ඉල්ලා සිටින ලදී. මෙම යෝජනා සඳහා විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

***06ඃ05 ගරු නාගරික මන්ත්‍රි රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා***

06ඃ05ඃ01 ඕලුගංතොට මෝවරිය පිටුපස ඇති ගමට ගමන් කිරීමට ඇති අඩිපාර වෙනුවට අඩි 12 ක පාරක් සඳහා රයිවත්ත වතුයායෙන් ඉඩම් අත්පත් කර ගැනීමට යෝජනා කිරීම.

06ඃ05ඃ02 ඕලුගංතොට රෝහලට රයිවත්ත වතුයායෙන් අක්කර 2ක් පමණ ඉඩම් ප්‍රමාණයක් අත්පත් කර ගැනීමට යෝජනා කිරීම.

06ඃ05ඃ03 පුරණගෙදර ප්‍රදේශයේ ඇති පොදු ළිඳ අළුත්වැඩියා කර දීම.

ගරු නාගරික මන්ත්‍රි රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රිනි පී.කේ.එන්.ටී.ඩී.සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් පවසා සිටි ගරු නාගරික මන්ත්‍රි රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින්

ඕලුගංතොට මෝචරිය පිටුපස ඇති ගමට ගමන් කිරීමට ඇති අඩිපාර වෙනුවට අඩි 12 ක පාරක් සඳහා රයිවත්ත වතුයායෙන් ඉඩම් අත්පත් කර ගැනීමට යෝජනා කර සිටි අතර දැනට පවතින අඩි 4 ක පමණ පාර ත්‍රීවිල් රථයක් ගමන් කිරීමට තරම්වත් ප්‍රමාණවත් නොවන බවත් ඉන් ජනතාව විඳින පීඩාව පිළිබඳවත් කරුණු පෙන්වා දෙන ලදී.එමෙන්ම,ඕලුගංතොට රෝහලටද දැනටපවතින ඉඩකඩ ප්‍රමාණවත් නොවන හෙයින් රයිවත්ත වතුයායෙන් අක්කර 2ක් පමණ ඉඩම් ප්‍රමාණයක් අත්පත් කර ගැනීමට යෝජනා කර සිටි අතර පුරණගෙදර ප්‍රදේශයේ ඇති පොදු ළිඳට වැසි කාලයේදී පාරේ ජලය ගලායන බැවින් අවශ්‍ය අළුත්වැඩියා කිරීම් සිදු කිරීම සුදුසු බවත් පවසා සිටින ලදී.

රයිවත්ත වතුයායෙන් ඉඩම් ප්‍රමාණයක් අත්පත් කර ගැනීමට ගෙනා යෝජනාව පිළිබඳ ඉදිරියේදී අදාළ ප්‍රාදේශිය ලේකම් සමග සාකච්ඡා කර සුදුසු පියවරක් ගැනීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් පවසා සිටි අතර විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

***06.06 ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය***

06.06.01 උඩකන්ද මාර්ගය සම්පූර්නම විනාශ වී ඇති හෙයින් එය හැකි ඉක්මනින් පිළිසකර කර දීම.

06.06.02 නගර සභා සුහ සාධන සමිතියේ සාමාජිකයන්ගේ අවශ්‍යතා සඳහා ලබාදීමට හට් එකක් සහ පුටු 100 ක් ලබාදීම.

06.06.03 කරවිකැටිය,උඩකන්ද,ගල්වල පාර,කොටුගොඩැල්ල මාර්ග දෙපස එම මාර්ගයන් දෙපස එම මර්ගවලට නැමී ඇති සියළුම ගස්වල අතු කපා ශුද්ධ පවිත්‍රකර දීම.

ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රි එම්.ඩබ්.විමළසිරි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් උඩකන්ද මාර්ගය සම්පූර්නම විනාශ වී ඇති හෙයින් එය හැකි ඉක්මනින් පිළිසකර කර දෙන මෙන් කිහිප වතාවක් ඉල්ලීම් කර ඇති බවත් ඒ පිළිබඳව සභාවේ අවධානය යොමු කරන මෙන් ඉල්ලා සිටින බව ඉල්ලා සිටි අතර, නගර සභා සුහ සාධන සමිතියේ සාමාජිකයන්ගේ අවශ්‍යතා සඳහා ලබාදීමට හට් එකක් සහ පුටු 100 ක් ලබාදීම ඉතා වැදගත් බැවින් ගරු සභාවේ අවධානය ඒ සඳහා යොමු කරන ලෙසත් ඉල්ලා සිටින ලදී.

එමෙන්ම කරවිකැටිය,උඩකන්ද,ගල්වල පාර,කොටුගොඩැල්ල මාර්ග දෙපස එම මාර්ගයන් දෙපස එම මාර්ගවලට නැමී ඇති සියළුම ගස්වල අතු කපා ශුද්ධ පවිත්‍රකර දෙන ලෙසද ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් මෙහිදී ඉල්ලා සිටින ලදී.

මේ සඳහා පිලිතුරු ලබාදුන් ගරු සභාපතිතුමන් විසින් උඩකන්ද මාර්ගයේ කාණු ස්ලැබ් කිරීම සම්බන්ධව කටයුතු නොබෝ දිනකින් ආරම්භ කිරීමට නියමිත බවත්, නගර සභා සුභ සාධන සමිතියේ සාමාජිකයන්ගේ අවශ්‍යතා සඳහා හට් එකක් සහ පුටු 100 ක් ලබාදීම අත්‍යවශ්‍ය කරුණක් වුවද එම භාණ්ඩ ආරක්ශා කරගැනීම සම්බන්ධයෙන් නිසි ක්‍රම වේදයක් සකස්කර ගත් පසු එය ක්‍රියාත්මක කිරීම සුදුසු බවත් පවසා සිටින ලදී. මෙහිදී විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**07. කාරක සභා වාර්තා, කමිටු වාර්තා සළකා බැලීම.**

මෙහිදී 2018.11.07 දින පැවති මුදල් හා කර්මාන්ත කමිටු වාර්තාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමී මැතිතුමන්ගේ යෝජනා ස්ථිරත්වයෙන් සභාවේ ඒකමතිකව සම්මත විය.

**08. ආදායම් වියදම් වාර්තා සළකා බැලීම.**

| | |
|---|---|
| **පුනරාවර්ථන ලැබීම්** | **7,858,790.75** |
| **වෙනත් ලැබීම්** | **1,203,130.03** |
| **මුලු ලැබීම්** | **9,061,920.78** |
| **පුනරාවර්ථන වියදම්** | **7,461,459.16** |
| **වෙනත් වියදම්** | **1,891,664.98** |
| **මුලු වියදම්** | **9,353,124.14** |

**•ඉන්ධන වාර්තාව සභාවට ඉදිරිපත් කිරිම.**

**2018 -11-01 සිට 2018-11-30 දක්වා**

| වාහන අංකය | මුළු එකතුව |
|---|---|
| 150-0248 | 1,350.00 |
| 227-5020 | 15,298.00 |
| | 13,920.00 |
| | 13,320.00 |
| 37-7933 | 574.00 |
| BC-0005 | 58,700.00 |
| | 22,200.00 |
| DPP -0006 | 6,315.00 |
| | 8,350.00 |
| DDR0008 | 1,093.00 |
| | 580.00 |
| GC 0001 | 8,595.00 |
| GC 0001 | 5,100.00 |
| FP 0002 | 8,400.00 |
| GK-1483 | 6,080.00 |
| | 8,880.00 |
| GK-6227 | 16,885.00 |
| GK-6227 | 27,144.00 |
| JD-4684 | 2,520.00 |
| | 1,490.00 |
| LL-2110 | 14,650.00 |
| LL-7688 | 5,800.00 |
| | 5,550.00 |
| HF-8558 | 5,435.00 |
| ND-5124 | 12,528.00 |
| | 6,222.00 |
| | 24,864.00 |
| PF-4006 | 5,978.00 |
| PF-4006 | 8,280.00 |
| QL-2901 | 4,480.00 |
| RB-4786 | 23,235.00 |
| | 5,800.00 |
| RC-1107 | 11,100.00 |

| | |
|---|---|
| RC-1107 | 5,800.00 |
| wl -7897 | 1,400.00 |
| RC-1118 | 17,830.00 |
| | 19,980.00 |
| VI-1833 | 1,750.00 |
| RD-8000 | 5,550.00 |
| RC - 8183 | 14,335.00 |
| | 25,530.00 |
| RD-8240 | 10,440.00 |
| | 18,870.00 |
| MIXB-0011 | 2,800.00 |
| SDRR 0013 | 0.00 |
| UQ - 1933 | 2,240.00 |
| 226-7521 | 6,960.00 |
| | 6,660.00 |
| BFS 4462 | 1,350.00 |
| ZA - 0228 | 6,660.00 |
| ZA - 5039 | 33,300.00 |
| ZA-5039 | 24,882.50 |
| **එකතුව** | **565,703.50** |

විරෝධතා නොමැති හෙයින් ආදායම් වියදම් වාර්තා සභා සම්මත විය.

**ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමන් ප.ව.2.00 ට පමණ සභා ගර්භයෙන් පිටත්ව යන ලදී.**

**09. පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්**

**ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමළසිරි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමළසිරි මැතිතුමා අදහස් දක්වමින් පොළ භූමියේ පාරට වෙන්න එළවළු හා බඩු භාහිරාදිය අසුරා විකුණන බවට කරුණු සැල වී ඇති බැවින් ඉන් ඇතිවන ගැටළු පිළිබඳව ගරු සභාවේ අවධානය යොමුකරන ලෙස පවසා සිටි අතර ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා යෝජනා කල පරිදි 2019 වර්ෂයේ පළමු වසරට ඇතුළත් කිරීමට බලාපොරොත්තු නගර සභා සීමාවේ ස්ථිර

පදිංචි දරු දැරියන්ට සිදුවන අසාධාරණය පිළිබඳව සභාවේ අවධානය යොමුකල යුතු බවත්, ඒ සඳහා සාධාරණ විසඳුමක් තිබිය යුතු බවත් පවසා සිටින ලදී.

එමෙන්ම බොහෝ කලක් පානීය ජල ගැටළුවකට මැදි වී සිටි වෑ කුඹුර,කොටුගොඩැල්ල ගම් වැසියන්ට පානීය ජලය ලබාදීමට මුදල් අනුමත කරදීම පිළිබඳව ගරු සභාවට බෙහෙවින් ස්තුතිවන්ත වන බව පවසා සිටි ගරු නාගරික මන්ත්‍රි එම්.ඩබ්.විමළසිරි මැතිතුමා මාර්ගය දෙපස වල් බිහිවීමෙන් ගමන් කිරීමට අපහසු තත්වයට පත්ව ඇති වෑ කුඹුර,කොටුගොඩැල්ල පෙදෙස්වල මාර්ග දෙපස ශුද්ධ පවිත්‍ර කර දෙන මෙන් ඉල්ලා සිටින ලදී. අවසන් වශයෙන් එළඹෙන 2019 නව වසර සියළුම දෙනාට සෞභාග්‍ය සම්පන්න සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරමින් සිය කථාව අවසන් කරන ලදී.

**<u>ගරු නාගරික මන්ත්‍රි එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා</u>**

ගරු නාගරික මන්ත්‍රි එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා අදහස් දක්වමින් දෙහිගස්තළාව කහටපිටිය මාර්ගය ඉතා අබලන් තත්වයට පත්ව ඇති හෙයින් ඒ සම්බන්ධව කඩිනම් අවධානය යොමුකරන ලෙස ඉල්ලා සිටි අතර,එම මාර්ගය නගර සභාවට අයිති මාර්ගයක් නොවේනම් පළාත් සභාවේ අදාළ අංශ සමඟ සාකච්ඡා කර තීරණයකට එළඹීම නගර සභාවට බදු ගෙවන හා ඡන්දය ලබාදෙන එම ජනතාවට සිදු කරන මහඟු සේවයක් බවත් පවසා සිටින ලදී. එමෙන්ම දැනට සභාව වෙත ලබාදී ඇති යෝජනා ක්‍රියාත්මක කිරීම පිළිබඳ ගරු සභාවේ අවධානය යොමුකරන මෙන් ඉල්ලා සිටි ගරු නාගරික මන්ත්‍රි එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා, 2019 නව වසර ශ්‍රි ලංකා වාසී සියළුම ජනතාවට ස්ථිර ආණ්ඩුවක් සහිත සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරමින් කරුණු දැක්වීම අවසන් කරන ලදී.

**<u>ගරු නාගරික මන්ත්‍රි ලාල් ගලප්පත්ති මැතිතුමා</u>**

ගරු නාගරික මන්ත්‍රි ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් අදහස් දක්වමින්,නාගරික සංවර්ධන අධිකාරියේ ගොඩනැගිල්ල ඉදිකර අවසන් වුවද වාහන නැවතුම් පහසුකම් සකස් කර නොමැති බවත් කාර්පාක් භූමිය ඒ සඳහා අපේක්ෂා කරන බව හැඟීයන හෙයින් ඒ සඳහා සභාවේ මැදිහත්වීම අවශ්‍ය බවත් පවසා සිටින ලදී. එමෙන්ම මින්පෙරද ඉල්ලීම් කර ඇති පරිදි ලංකා බැංකුව පරිශ්‍රයට වාහනයක් ඇතුළු කිරීමට හැකිවන පරිදි පිවිසුම අසළ කොන්ක්‍රීට් කරදෙන ලෙස පවසා සිටි අතර ඊට පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමන් විසින් , කාර්මික නිළධාරි මහතා යොදවා නිරීක්ෂනය කිරිමෙන් අනතුරුව ඉදිරි පියවර ගැනීම සිදුකරන බව පවසා සිටින ලදී.

එමෙන්ම පදික වෙළඳුන් සඳහා ඉදිකරන ලද කඩ පේළිය සඳහා විදුලිය නොමැති කම නිසා ඒ සඳහා සුදුසු කඩිනම් ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස පවසා සිටි අතර ලංකා බැංකුව අසළ බිම් කොටසෙ ත්‍රීවිල් ගමන් කිරීමට හැකි වන පරිදි සකස් කර දෙන මෙන් පවසා සිටින ලදී. කරවිකැටිය මාර්ගය සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වන පවසා සිටි ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් දෙහිලස්තලාව මුස්ලිම් දේවස්ථානය අසළ කාණුවේ බැම්ම සකස්කර දෙන මෙන් පල්ලියෙන් ඉල්ලීමක් කරන ලද බවත් ඒ පිළිබඳව ගරු සභාවේ අවධානය යොමුකරන ලෙසත් ඉල්ලා සිටින ලදී. නගර සභා ශාඛා පුස්තකාල පිහිටුවීම පිළිබඳව පවසා සිටි ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා ඒ සඳහා හඳුනාගනු ලැබූ ස්ථාන ලෙස වැවවත්ත පෙරපාසල අසළ, රෝහල් භූමිය, බෝම්බුව, ඇල්ලෙපොළ හා සමූපකාර මන්දිරය උඩුමහළ යන ස්ථාන සුදුසු බව පවසා සිටින ලදී. කඩකුළී අඩුකිරීම සම්බන්ධ සාකච්ඡා කිරීම සඳහා ගරු ආණ්ඩුකාරවරිය හමුවීම සඳහා දිනයක් යොදාගැනීම සුදුසු බව යෝජනා කල ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා තානායම් පාර අසළ බස් නැවැත්වීම වැළැක්විය හැකි දෙයක් නොවන බැවින්, වාහන නොනවත්වන ඉරි ගැසීම සුදුසු බව යෝජනා කරන ලදී.

බළගහමුල ළිඳ පිළිබඳව ප්‍රගතිය විමසා සිටි අවස්ථාවේ ඊට පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමන් විසින් එම ස්ථානයට අවශ්‍ය රැදවුම් බැම්ම සකස් කිරීමෙන් පසු,නගර සභා ජල බවුසර් රථ සඳහා ජලය පිරවිය හැකි වන සේ ළිඳ නඩත්තු කොට,ආදායම් උත්පාදන වෙළෙඳ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අපේක්ෂාවෙන් සිටින බව පවසා සිටින ලදී. ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමන් විසින් මෙම ස්ථානයට පිවිසිය හැකි පරිදි හිටපු සභාපතිවරයෙක් ගේට්ටුවක් දමා ඇති බවත් ඒ සඳහා ක්‍රියාමාර්ගයක් ගත යුතු බවත් පෙන්වා දෙන ලදී. එමෙන්ම තම කොට්ඨාශයේ කිසිදු සංවර්ධන කාර්යයක් තවමත් සිදු නොවීම පිළීබඳ පවසා සිටිගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමන් විසින් 2019 නව වසර සියළු දෙනාමට සාර්ථක සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරමින් සිය කථාව අවසන් කරන ලදී.

**<u>ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා</u>**

ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් අදහස් දක්වමින් මෙම වර්ෂයට පවත්වන ලද 8 වෙනි සභාව පවත්වන අද දින වන විට කිසිදු මන්ත්‍රීවරයෙක් සඳහා වැඩි වරප්‍රසාද ලබාදුන් බවට නොසිතන ලෙසත්, කඩිනමින් කල යුතු සංවර්ධන කාර්යයන් සඳහා ප්‍රමුඛත්වය ලබාදී ක්‍රියාකල බවත් පවසා සිටි අතර තමා වෙත එල්ල කරන චෝදනාවලින් කිසිදා නොසැලෙන බවත් තම පක්ෂයේ සංවිධායක විසින් ලිඛිතව ලබාදුන් පරිදි තමන් ක්‍රියාකලා විනා කිසිදු විටෙක පක්ෂ මාරුවක් සිදු කල නොමැති බවත් පවසා සිටින ලදී.

සභාවේ සියළු සභිකයන් අතරින් සභා නීති රීති පිළිබඳව විශේෂ දැනුමක් ඇති ගරු නාගරික මන්ත්‍රී වසන්ත ගුණරත්න මැතිතුමා සුවිශේෂී චරිතයක් බවත් සැම විටම පක්ෂ භේදයෙන් තොරව සහයෝගයෙන් සමගියෙන් දූනුම බෙදා හදාගනිමින් ජනතාවට අවැසි සංවර්ධනය ලබාදීමට ක්‍රියාකරමුයි මෙහිදී පවසා සිටින ලදී. එමෙන්ම සුබහිර් අලී මාවතේ වැහි නැති කාලයටත් වැසි පරිද්දෙන් නිරන්තරයෙන් ජලය රැදී පවතින බැවින් ඒ පිළිබඳ ගරු සභාවේ අවධානය යොමුකරන මෙන් ඉල්ලා සිටින ලදී. එළඹෙන 2019 වර්ෂය සියළුම දෙනාට සාර්ථක සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරමින් සිය අදහස් දූක්වීම අවසන් කරන ලදී.

<u>ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා</u>

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් සුනන්දාරාමය ජල යෝජනා ක්‍රමය පිලිබඳ අවශ්‍ය අවධානය යොමුකර එම කටයුතු සිදු කිරීම පිළිබඳව ස්තුතිවන්ත වන බව පවසා සිටි අතර, එහි පළමු අදියර ලෙස දූනට සකස් කර ඇති ඇස්තමේන්තුව ක්‍රියාත්මක කරන ලෙස යෝජනා කර සිටි අතරම එහි දිගුව ලෙස ඉතිරි කොටස ක්‍රියාවට නැංවීමට සහය වන ලෙස ඉල්ලා සිටින ලදී.

එමෙන්ම ජනතා ඡන්දයෙන් තේරි පත් වූ මන්ත්‍රීවරුන් ලෙස එම ජනතාවට සේවය කිරීම සැමගේ සාමුහික වගකීම වන බැවින් කොට්ඨාශවලට මුදල් වෙන් කිරීමේදි සිදුවන විෂමතා පිලිබඳ විවේචනය කිරීමට සිදුවූ බවත් සැමගේ අපේක්ෂාව ජනතා සේවය බැවින් 2019 වසරේ හෝ එය නිවැරදි කරනු ඇතැයි අපේක්ෂා කරන බව පවසා සිටි ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ලබන්නා වූ 2019 නව වසර සැමට වාසානාවන්ත සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරමින් අදහස් දූක්වීම නිමා කරන ලදී.

<u>ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය</u>

ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් අදහස් දක්වමින් කරවිකැටිය මාර්ගයේ සංවර්ධන කාර්යයන් ආරම්භ කිරීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වන බව පවසා සිටි අතර, උඩකන්ද මාර්ගයේ තත්වයද ඉතා අසතුටුදායක බැවින්, ඒ පිළිබඳවද ගරු සභාවේ අවධානය යොමුකරන මෙන් ඉල්ලා සිටින ලදී.එමෙන්ම උඩ කන්ද මාර්ගයේ කසළ ට්‍රැක්ටරය ගමන් නොකිරීම පිළිබඳවද ගරු සභාවේ අවධානය යොමුකරන මෙන් ඉල්ලා සිටින ලදී.

2019 අයවැය ලේඛනයෙන් නගරයේ සංවර්ධනය සඳහා යොජනා රැසක් ඉදිරිපත් වී ඇති බව පැවසූ ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය,එමගින් නගරයේ බොහෝ ගැටළුවලට සාර්ථක විසඳුම් ලැබෙනු ඇතැයි අපේක්ෂා කල හැකි බව පවසා සිටින ලදී.දැනට සිදු කරගෙන යන ව්‍යාපෘති සඳහා මුදල් ලබාදුන් සියළු දෙනාට ස්තුතිවන්ත වනබව පවසා සිටි අතර,කරවිකැටිය ගල්වල පාරේ වාහන ගමන් කිරීමට හැකියාවක් නොමැති කමින් මහජනතාව මහත් පීඩාවකට පත්ව ඇති බැවින් ඒ සඳහා සාර්ථක විසඳුමක් කඩිනමින් ලැබෙනු ඇතැයි අපේක්ෂා කරන බව පවසා සිටින ලදී. 2019 නව වසර සියළු දෙනාට සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරමින් ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය සිය අදහස් දැක්වීම අවසන් කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රි එම්.ඩබ්.විමළසිරි මැතිතුමා ප.ව. 2.35 ට පමණ සභා ගර්භයෙන් පිටත්ව යන ලදී.

**<u>ගරු නාගරික මන්ත්‍රිනි එම්.ශාන්තිලේඛා මැතිතුමිය</u>**

ගරු නාගරික මන්ත්‍රිනි එම්.ශාන්තිලේඛා මැතිතුමිය විසින් අදහස් දක්වමින්,2018 වර්ෂයෙ මුල සිටම විවාදයට බඳුන් වූ රු.500,000.00 දක්වා වියදම් කිරීමට මුදල් කමිටුවට බලය පැවරීමේ යෝජනාව විවිධ මතභේදයන්ට ලක් වෙන්නක් බැවින් එහි බලතල ක්‍රියාත්මක කිරීමේදී නීත්‍යානුකූලව හා විනිවිද භාවයෙන් යුත්කව සිදු කරන මෙන් ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින ලදී.

කම්කරු විනිශ්චය සභාව බලංගොඩ නගරයේ නැවත ස්ථාපිත කිරීමේ යෝජනාවේ වර්තමාන ප්‍රගතිය පිළිබඳව විමසා සිටි පැනයට පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමන් විසින්, ලිපිය අදාළ අමාත්‍යාංශ වෙත යොමු කර ඇති බවත්, රටේ දේශපාලන අස්ථාවරත්වය වෙනස් වූ පසු ඒ පිළිබඳ ක්‍රියාමාර්ගයක් ගැනීමට අපේක්ෂා කරන බවත් පවසා සිටින ලදී.

බලංගොඩ නගරයේ ඩෙංගු රෝගය ඉතා ඉක්මනින් පැතිරී යාමේ අවදානමකට මුහුන දී ඇති බැවින් නගර සභාව ඒ සඳහා මැදිහත් වී ක්‍රියාමාර්ගයක් ගැනීම සුදුසු බව පවසා සිටි ගරු නාගරික මන්ත්‍රිනි එම්.ශාන්තිලේඛා මැතිතුමිය විසින් උඩ ඇල්ලෙපොළ මූකලන්වත්ත පාරේ හා පල්ලෙකුඹුර පාරේ කාණු පද්ධතිය සඳහා ප්‍රතිපාදන ලබාදීම පිළිබඳ ස්තුතිවන්ත වන බව පවසා සිටි අතර එම මාර්ගවල අනෙකුත් සංවර්ධන කාර්යයන් කඩිනමින් ඉටුකරදීම පිළිබඳ සභාවේ අවධානය යොමුකරන මෙන ඉල්ලා සිටිමින් ලබන්නා වූ නව වර්ෂය සැමට සුභ නව වසරක් වේවායි පතමින් සිය අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**<u>ගරු නාගරික මන්ත්‍රිනි පී.චන්ද්‍රලතා මැතිතුමිය</u>**

ගරු නාගරික මන්ත්‍රිනි පී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් අදහස් දක්වමින් පසුගිය මාස කීපය තුළ මන්ත්‍රි ප්‍රතිපාදන හරහා කොට්ඨාශය තුළ සිදුකරන ලද සංවර්ධනය සඳහා ස්තුතිවන්ත වන බව පවසා සිටි අතර

ඉතිරි අවශ්‍යතා ඉටුකර දීම පිළිබඳවද ගරු සභාවේ අවධානය යොමුකරන මෙන් ඉල්ලා සිටින ලදී. එමෙන්ම රණවිනාවත්ත ගමට ජලය ලබාදීම සඳහා තමා විසින් යෝජනාවක් ගෙන ඒමේදි එය ක්‍රියාවට නැංවීම සභාව මැදිහත්ව නතර කර දැමූ බැවින් එම ගම්වාසීන්ට විශාල අසාධාරණයක් වූ බවත්, එය කඩිනමින් ඉටුකර ගම්වාසීන්ට සහනයක් ඉටුකරදෙන ලෙෂත් පවසා සිටින ලදී.

එමෙන්ම සුදර්ශනගම කසළ ගැටළුවට තවමත් සාධාරණ විසඳුමක් නොලැබුන බවත්, ආනන්ද මෛත්‍රිගම මංසන්ධියේ කසළ දමා යෑම විශාල ප්‍රශ්නයක් බැවින් ඒ පිළිබඳවද සභාවේ අවධානය යොමුකරන මෙන් ඉල්ලා සිටින ලදී. ලබන්නා වූ 2019 වර්ෂය නව වර්ෂය පක්ෂ භේදයෙන් තොරව සැමට සංවර්ධනය සඳහා දායකත්වය ලබාදෙන මෙන් ඉල්ලා සිටි ගරු නාගරික මන්ත්‍රිනි පී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් සැමට සුභ නව වසරක් වේවායි පතමින් සිය අදහස් දැක්වීම අවසන් කරන ලදී.

<u>ගරු නාගරික මන්ත්‍රි වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා</u>

ගරු නාගරික මන්ත්‍රි වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා විසින් අදහස් දක්වමින්, මහජන නියෝජිතයින් වශයෙන් සභාවට පත් වූ සැමගේ අපේක්ෂාව වෙන්නේ මහජනතාවට සේවය කිරීම බව පවසා සිටි අතර අයවැය ඉදිරිපත් කිරීම සඳහා පවත්වන ලද සභාවට තම පක්ෂය නියෝජනය කරන කන්ඩායම පැමිණියේ නම් නිසැකවම අයවැය පරාජය වීමට ඉඩ තිබූ බවත් එහෙයින් එසේ නොපැමිණීම පිළිබඳව සතුටු වන ලෙසත් පවසා සිටි අතර,මෙම ප්‍රදේශයේ අනෙකුත් සභා වන ඉඹුල්පේ ප්‍රාදේශිය සභාවේ එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රිවරුන් හා එක්සත් නිදහස් සන්ධාන මන්ත්‍රිවරුන් අයවැය සඳහා ඡන්දය පාවිච්චචි කිරීමෙන් වැළකී සිටි අතර ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රිවරයා අයවැයට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කල බවත්,බලංගොඩ ප්‍රාදේශිය සභාවේ ඒකමතිකව ඡන්දය ජයග්‍රහණය කල බවත් පවසා සිටි ගරු නාගරික මන්ත්‍රි වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා බලංගොඩ නගර සභාවේ අයවැය සම්බන්ධව ඡන්දය ප්‍රකාශ කිරීමට ඊට වඩාත් පරස්පර විරෝධි බව පවසා සිටින ලදී.

දැනට රටේ පවතින තත්වය ව්‍යාකූල බව පවසා සිටි ගරු නාගරික මන්ත්‍රි වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා වර්ෂ 2500 ක සිට ඉන්දීය ආක්‍රමණ 17 ක් හා පෘතුගීසි,ලන්දේසි,ඉංග්‍රිසි හා අළුතෙන් එක් වූ වෙන්දේසි ආක්‍රමණ රාශියකට මුහුණ දුන් රට බටහිර බලවේගවලින් බේරාගත හැකි ,රටේ ජනතාවගේ අපේක්ෂාවන් සඵල කලහැකි දක්ෂ නායකයෙක් බිහිවේවායි ප්‍රාර්ථනා කරන බවත්, 2018 වර්ෂයේ මෙන් නොව ඉදිරියේදි සභාවේ මන්ත්‍රිවරුන්ට සාධාරණ පරිදි ප්‍රතිපාදන ලබාදෙන මෙන් ඉල්ලා සිටින බවත්

පවසා සිටින ලදී. එළඹෙන 2019 වර්ෂයේ සියළුමදෙනාට තම කටයුතු සාර්ථක කර ගැනීමට අවශ්‍ය ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරමින් සිය අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**10. අවසානය**

ගරු සභාපතිතුමන් විසින් අදහස් දක්වමින් ජාතික දේශපාලනය අළලා කථා කිරීමට මෙහිදි අවශ්‍යතාවයක් නැති මුත් එක් එක් දේශපාලන නායකයන්ගේ දර්ශනය වෙනස් බැවින්, ඔවුන් සම්බන්ධ විවේචනය කිරීමෙන් වළකින මෙන් ඉල්ලා සිටින බව පවසා සිටින ලදී. 1948 නිදහස ලැබෙන විට ආසියාවේ අන් සෑම රටකටම වඩා ඉදිරියෙන් සිටි ශ්‍රී ලංකාව වර්තමානය වන විට රටක් ලෙස ඉතා පහතට ගොස් ඇති බවත් එදා මෙදා තුර වැඩි වශයෙන් රට පාලනය කල කුමන රජයන්දැයි මොහොතක් සිතා බලන ලෙසත් පවසා සිටින ලදී. එක් එක් දේශපාලන නායකයන්ගේ මති මතාන්තර අනුව රට පිළිබඳ තීරණ ගැනීම යෝග්‍ය නොවන බවත් දක්ෂ දේශපාලන නායකත්වයක් රදේ අනාගතය වෙනුවෙන් රටට අවැසි බවත් මෙහිදී පවසා සිටින ලදී.

තම සීයා හා තාත්තා පිරිසිදු දේශපාලන චරිතයන් වූ බැවින් එවන් පිරිසිදු චරිත තුළින් තමන් හට උරුම වූ මෙම දේශපාලන ගමන ඉතා සාර්ථකව හා සුපිරිසිදුව කර ගෙන යාම තම අභිලාෂය බව පවසා සිටි ගරු සභාපතිතුමන් දේශපාලයේදි විවිධ හිත් රිදීම්,කලකිරීම් සිදුවීම වැළැක්විය නොහැක්කක් බවත් ඉදිරි ගමන ඉතා සාමුහිකව ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රිවරු සියළු දෙනාටම තම කොට්ඨාශයන්හි සංවර්ධන කාර්යයන් සිදු කිරීම සඳහ තම සහයෝගය ලබාදෙන බවත් පවසා සිටින ලදී. එමෙන්ම සභාවේ කාර්යයන් සිදු කර ගෙන යාමේදි තම යෝජනා සඳහා ඡන්දය ලබා දුන් පිරිසට වඩා නොදුන් මන්ත්‍රිවරුන්ය ස්තුති වන්නේ, එවන් සිද්ධි නිසා තමා වඩා වඩාත් ශක්තිමත් වූ නිසා බව ගරු සභාපතිතුමන් විසින් මෙහිදී පවසා සිටින ලදී.

සභාවේ වැඩ කටයුතු සාර්ථකව සිදු කර ගෙන යාමට සහයෝගය ලබාදුන් සුළු සේවකයාගේ සිට ඉහළම නිළධාරියා දක්වාත්, මහජන නියෝජිත අදහස් රටට ගෙන ගිය මාධ්‍යවේදීන්ටත්,ගෞරවනීය ස්තුතිය පිරිනමන බව පවසා සිටි ගරු සභාපතිතුමන් විසින් ලබන්නාවූ 2019 වර්ෂය සෑම සියළු දෙනාටම තම පුද්ගලික අපේක්ෂාවන් මෙන්ම ප්‍රජාව වෙනුවෙන් ඉටුකිරිමට ඇති අපේක්ෂාවන් මුදුන්පත් කර ගත හැකි සාර්ථක නව වසරක් වේවායි ප්‍රර්ථනා කරමින් මෙදින සභාවේ වැඩ කටයුතු ප.ව.3.30 ට පමණ අවසන් කරන ලදී.

**චමික ජයමිණි විමළසේන,**
**සභාපති,**
**බලංගොඩ නගර සභාව.**